සියලුම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2018

## 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ලකුණු බෙදීයාම

### 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - I

පළමු පත්‍රයට බහුවරණ ප්‍රශ්න 50 ක් අඩංගු වෙයි.

- එක් ප්‍රශ්නයකට ලකුණු $= 02$
- ප්‍රශ්න 50 ලකුණු $2 \times 50 = 100$

### 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - II

**I - කොටස**

පළමු කොටස ප්‍රශ්න 03 කින් සමන්විත වෙයි. ඉන් ප්‍රශ්න 02 ට පිළිතුර සැපයීම අපේක්ෂා කෙරෙයි.

පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 02

- එක් ප්‍රශ්නයකට ලකුණු $= 20$
- ප්‍රශ්න 02 ලකුණු $2 \times 20 = 40$

**II - කොටස**

දෙවන කොටස ප්‍රශ්න 05 කින් සමන්විත වෙයි. ඉන් ප්‍රශ්න 03 ට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරෙයි.

පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 03

- එක් ප්‍රශ්නයකට ලකුණු $= 20$
- ප්‍රශ්න 03 ලකුණු $3 \times 20 = 60$

I සහ II කොටස් සඳහා මුළු ලකුණු සංඛ්‍යාව $5 \times 20 = 100$

අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - I | - $50 \times 02$ | $= 100$ |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - II | - $05 \times 20$ | $= 100$ |
| | | 200 |

අවසාන ලකුණු සංඛ්‍යාව $200/2 = 100$

# ලකුණු දීමේ පටිපාටිය පිළිබඳ විස්තරය

I පත්‍රය - ප්‍රශ්න පත්‍රය

I පත්‍රය පිළිතුරු

2 පත්‍රය - ප්‍රශ්න පත්‍රය

2 පත්‍රය - පිළිතුරු

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ :** ප්‍රශ්න අංක 03

(i) ..............................................................
..............................................................
.............................................................. √ △ $\frac{4}{5}$

(ii) ..............................................................
..............................................................
.............................................................. √ △ $\frac{3}{5}$

(iii) ..............................................................
..............................................................
.............................................................. √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

## I - කොටස

**ප්‍රශ්න අංක 01**

**මෙම ප්‍රශ්නය අනුකොටස් 5 කින් සමන්විත වේ.**

එක් ප්‍රශ්නයකට ලකුණු 04

කොටස් 5 ට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 02**

මෙම ප්‍රශ්නය අනු කොටස් 5 න් සමන්විත වේ.

එක් ප්‍රශ්නයකට ලකුණු 04

කොටස් 5කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 03**

**මෙම ප්‍රශ්නය අනු කොටස් 5 කින් සමන්විත වේ**

**එක් ප්‍රශ්නයකට ලකුණු 04**

කොටස් 5කට ලකුණු 5 x4 20

## II - කොටස

**ප්‍රශ්න අංක 04**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 05**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 06**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 07**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 08**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

## ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - I

මෙම ප්‍රශ්න පත්‍රයට බහුවරණ ප්‍රශ්න 50 ක් ඇතුළත් වන අතර ප්‍රශ්න 50 ටම පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.ප්‍රශ්න සැකසීමේ දී මුළු විෂය මාලාවම ආවරණය වන සේ ඒවා සකසා ඇත. එමගින් විෂය පිළිබඳව ශිෂ්‍යයා තුළ පූර්ණ දැනුමක් තිබේදැයි පරීක්ෂා කිරීමට හැකියාව ලැබෙනු ඇත.

## ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - II

මෙම ප්‍රශ්න පත්‍රයට කොටස් දෙකක් ඇතුළත් වන අතර පළමු කොටසේ ප්‍රශ්න 3 න් 2 ක් ද, දෙවන කොටසේ ප්‍රශ්න 5 න් 3 ක් බැගින් ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

01 ප්‍රශ්නය

අපෝස්තුලුවරුන්ගේ අත්තිවාරම මත ගොඩ නැගුණ සභාවේ ධර්මය ආරක්ෂා කිරීමේදීත් කිතු දහමේ ගැඹුරු අදහස් මෙනෙහි කර ඒවා පහදා දීම සම්බන්ධයෙනුත් තාපසවරුන්ගෙන් හා සභා පීතෘන්ගෙන් සුවිශාල මෙහෙයක් ඉටු වුණි. අද අප පිළිපදින ධර්මය ගොඩනැගී ඇත්තේ එතුමන්ලා දැමූ පදනම මතය. මෙම පළමු ප්‍රශ්නය මගින් තාපසවරුන්ගේ ජීවිතය සහ සභා පීතෘන් පිළිබඳ දැනුම විමර්ශනය කෙරෙයි.

02 ප්‍රශ්නය

මධ්‍යතන යුගය සභාවේ රන් යුගය මෙන්ම සභාවේ අඳුරු යුගයක ද වෙයි. එක් අතකින් බොහෝ දේව ධර්ම ශාස්ත්‍රඥයන් බිහිවෙද්දී, තාපසාරාම මගින් අධ්‍යාත්මික වර්ධනයක් සිදු කරද්දී මෙන්ම කලාව ගෘහ නිර්මාණ ශිල්පය ආදීය වැඩි වර්ධනය වෙද්දී සභාව වඩ වඩාත් ලෞකිකත්වයට බරවීමක් හා දේපළ ඉඩකඩම් පාලනය කිරීම සඳහා පැවිදිවරුන් යොමු වීමකුත් දක්නට ලැබෙයි. මධ්‍යතන යුගයේ සභාවේ තිබූ මෙම ස්වභාවය පිළිබඳවත් ඒ අතරම තාපස නිකාය මගින් අධ්‍යාත්මික වර්ධනයට සිදු වූ සේවාවන් මෙම දෙවන ප්‍රශ්නය මගින් සාකච්ඡා කෙරේ.

03 ප්‍රශ්නය

ශුද්ධ වූ සභාව විශ්වීය එකකි. එය කිසිඳු එක් ජාතියකට හෝ සංස්කෘතියකට අයත් වූවක් නොවේ. එහෙයින්ම යම් දේශයක ශුභාරංචිය දේශනා කිරීමේ දී එම දේශයේ සංස්කෘතිය, ජනතා අභිලාෂයන් ආගම් හා දර්ශන පිළිබඳව සැලකිල්ලක් ඇතිවිය යුතු වෙයි. ධර්මදානයේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය බොහෝ විට ධර්මදානයේ ක්‍රම මත රඳී පවතියි. චීනයේ ජපානයේ හා ශ්‍රී ලංකාවේ ධර්මදානයේ දී ගත් ක්‍රියාමාර්ගයන් පිළිබඳව මෙම තුන්වන ප්‍රශ්නයෙන් සාකච්ඡා කෙරේ.

04 ප්‍රශ්නය

ක්‍රිස්තු ධර්මය යනු සදාචාරාත්මක නීති රීති පද්ධතියක් අනුගමනය කිරීමක් නොවේ. එය ක්‍රිස්තුත් වහන්සේට ඒ ආකාරයෙන් අනුගමනය කිරීමකි. කෙසේ වුවද ක්‍රිස්තුත් වහනසේගේ ධර්මය මෙලෝ වටිනාකම්වලින් එහා යන ස්වර්ග රාජ්‍යයෙන් ලෝකෝත්තර වටිනාකම්වලින් යුක්ත වූවකි. ක්‍රිස්තුත් වහන්සේගේ ධර්මය ඒ ආකාරයෙන් පිළිපැදීමේ දී ක්‍රිස්තු අනුගාමිකයන් මුහුණ දෙන අභියෝගය මෙම හතරවන ප්‍රශ්නයෙන් සොයා බැලෙයි.

05 ප්‍රශ්නය

ක්‍රිස්තු ධර්මය ආරම්භ වී ශත වර්ෂ කිහිපයක් ගතවනතුරුම යුරෝපීය සමාජය ගෝත්‍රයන්ගෙන් ගහණ වූවකි. නිරතුරුව සිදු වූ ගෝත්‍රික ආක්‍රමණ රාජ්‍යයන්ගෙන් නිදහසට හා වර්ධනයට තර්ජනයක් වූවා සේම කිතු දහම පහළ කිරීමට ද මහත් බාධාවක් විය. කෙසේ වුවද ක්‍රිස්තු වර්ෂ 9 වන ශත වර්ෂය වන විට යුරෝපීය සමාජය මුළුමණින්ම පාහේ ක්‍රිස්තු ධර්මය පිළිගෙන තිබිණි. ගෝත්‍රිකයන් පරාජය කිරීමට ගත් ක්‍රියා මාර්ගයන් හා ඔවුන් ක්‍රිස්තියානි ධර්මය වැළඳ ගැනීමෙන් යුරෝපයේ වර්ධනයට ඇති වූ බලපෑම් මෙම ප්‍රශ්නයෙන් විමර්ශනය කෙරේ.

06 ප්‍රශ්නය

කලාව දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට දුන් කදිම තිළිණයකි. සංගීතය දෙවියන් වහන්සේගෙන්ම ලැබූ දෙයක් හැටියට සමහරු සලකති. බොහෝ විට අතීතයේ සිටම කලා මාධ්‍යයන් වැඩිපුරම වර්ධනය වී ඇත්තේ ආගම මුල් කොට ගෙනය. මධ්‍යතන යුගයේ බිහි වූ කලා මාධ්‍යන් කිහිපයක් ගැන හා කලා මාධ්‍යන් ධර්ම දානයේ දී උපකාර වන ආකාරයක් පිළිබඳ සිසුන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරේ.

07 ප්‍රශ්නය

ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපීය ජාතීන් තුනෙන්ම යම් ආකාරයකින් ශ්‍රී ලංකා සමාජයට සේවාවක් සිදු වුණි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයන් පැමිණෙන විට සමාජය බොහෝ සේ වෙනස් වී තිබූ හෙයින් ඔවුන්ගේ සේවාව සුවිශේෂී එකකි. අධ්‍යාපන හා සමාජ සේවාවෙහි යෙදෙමින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියා කිරීමට බොහෝ දෙනෙකුට අවස්ථාව එළඹුණි. බ්‍රිතාන්‍ය සමයේ අධ්‍යාපන සහ සමාජ සේවාව පිළිබඳව මෙම හත්වන ප්‍රශ්නයෙන් විමර්ශනය කෙරෙයි.

08 ප්‍රශ්නය

දෙවන වතිකාවත මන්ත්‍රණ සභාවක් සමග ලෝකයේ එක් එක් කලාපවල රදගුරුතුමන්ලා තම කලාපයේ අවශ්‍යතා අනුව ධර්ම සේවාව කිරීම පිණිස සමුළු පිහිටුවා ගැනීමට අවස්ථාව ලැබුණ ආසියානු රදගුරු සමුළු සම්මේලනය එවැන්නකි. එය ආසියාවේ එක් එක් රදගුරු සමුළුවල එකතුවෙන් සැදුම්ලත් එකකි. කතෝලික නොවන අනෙකුත් කිතුනු සභා ද එක එක සභාවල ක්‍රියා කාරීත්වය ද එල ගැන්වීමේ අරමුණින් ලෝක කිතුණු සභා සම්මේලනය පිහිටුවා ගෙන ඇත. මෙම අටවන ප්‍රශ්නයෙන් ආසියානු රදගුරු සමුළු සම්මේලනයෙන්, ලෝක කිතුනු සභා සම්මේලනයෙන් සහ ලෝක කිතුනු සභා සම්මේනලයෙන් සිදුවන සේවාවන් කීපයක් විමර්ශනය කෙරෙයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.06 / 0830 - 1030

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා දක්වන්න.

**1.** සමාරියාව පිහිටා ඇත්තේ
(1) මුහුදුබඩ තැනිතලා පෙදෙසේ ය. (2) බටහිර කඳු මධ්‍යයේ ය.
(3) නැගෙනහිර කඳු මධ්‍යයේ ය. (4) ගිලුණු නිම්නයේ ය.
(5) ජුදයාවේ කාන්තාරයේ ය.

**2.** 'නෙගෙබ්' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) උතුර (2) මධ්‍යම (3) නැගෙනහිර (4) බටහිර (5) දකුණ

**3.** පහත රජවරුන්ගෙන් ඊශ්‍රායලයේ දකුණු රාජ්‍යය පාලනය කළ රජතුමා කවු ද?
(1) දාවිත් රජතුමා (2) සලමන් රජතුමා
(3) රෙහොබොවාම් රජතුමා (4) සාවුල් රජතුමා
(5) ජෙරබොවාම් රජතුමා

**4.** එලිජා සහ එලිෂා යන දිවැස්ප්‍රසාදිවරුන් දේශනා කළේ,
(1) උතුරු රාජ්‍යයේදී ය. (2) ගලීලයේදී ය.
(3) ජුදයාවේ කාන්තාර පෙදෙසෙහිදී ය. (4) දකුණු රාජ්‍යයේදී ය.
(5) සිරියාවේදී ය.

**5.** බැබිලෝනියාවේ විප්‍රවාසගතව සිටි ඊශ්‍රායෙල් ජාතිකයින්ව නිදහස් කළ රජතුමා කවුරුන් ද?
(1) ඩේරියස් (2) සයිරස් (3) නබුකද්නසාර් (4) ශෙඩෙකියා (5) නෙහෙමියා

**6.** ක්‍රි.පූ. 722 දී උතුරු රාජ්‍යය ආක්‍රමණය කරන ලද්දේ,
(1) ඊජිප්තුවරුන් ය. (2) සිරියානුවරුන් ය.
(3) ඇසිරියානුවරුන් ය. (4) බැබිලෝනියන්වරුන් ය.
(5) පර්සියන්වරුන් ය.

**7.** ස්පාඤ්ඤ කොලනියක් (යටත් විජිතයක්) බවට පත් වූ නැගෙනහිර ආසියානු රට,
(1) පිලිපීනයයි. (2) චීනයයි. (3) කොරියාවයි. (4) ජපානයයි. (5) තායිවානයයි.

**8.** අයිසෙක් නිව්ටන් විද්‍යාඥයා පිළිබඳව දැක්වෙන **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ඔහු දේවධර්ම ශාස්ත්‍රඥයෙකි.
(2) ඔහු විද්‍යාව සහ ශුද්ධ බයිබලය සම්බන්ධ ග්‍රන්ථ සම්පාදනය කළේ ය.
(3) ඔහු විශ්වාසය පිළිබඳ ගැටලුවකට මුහුණ දුන්නේ ය.
(4) ඔහු වෛද්‍ය විද්‍යා සොයාගැනීම් සම්බන්ධයෙන් නොබෙල් ත්‍යාගය දිනා ගත්තේ ය.
(5) ඔහු මුහුදේ වඩදිය-බාදිය ගැලීම සම්බන්ධයෙන් න්‍යායක් ඉදිරිපත් කළේ ය.

**9.** 'ගොතික්' යන වචනයෙහි තේරුම කුමක් ද?
(1) අහස දෙසට නික්මුණ උල් වූ කොත් තිබීම
(2) කුළුණු ගණනාවක් ඇති ගොඩනැගිල්ල
(3) වර්ණවත් වීදුරුවලින් අලංකාර වූවක් වීම
(4) මූර්ති කැටයම්වලින් සමන්විත වීම
(5) ම්ලේච්ඡ හෝ නීරස

**10.** තමා ඉදිරිපත් කළ විද්‍යාත්මක අදහස් නිසා දේෂ දර්ශනයට ලක් වූ තැනැත්තා වන්නේ,
(1) ඇල්බට් අයින්ස්ටයින් ය.
(2) සර් අයිසෙක් නිව්ටන් ය.
(3) තෙයියාර් ඩි ෂාර්ඩැන් පියතුමා ය.
(4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් ය.
(5) ඇලෙක්සැන්ඩර් ෆ්ලෙමින් ය.

**11.** ශ්‍රී ලංකාවේ දක්නට ඇති අයිකොන් පින්තූර සම්බන්ධයෙන් හොඳම නිදසුන වන්නේ,
(1) මඩු දේවමාතාවන්ගේ පින්තූරයයි.
(2) ශ්‍රී ලංකාවේ අප ස්වාමිදූවගේ පින්තූරයයි.
(3) සදාසරණයේ දේවමාතාවන්ගේ පින්තූරයයි.
(4) ලූර්දු මාතාවන්ගේ පින්තූරයයි.
(5) ෆාතිමාවේ මාතාවන්ගේ පින්තූරයයි.

**12.** 16 වන ශත වර්ෂය වන තුරු ස්වාධීන කලාවක් ලෙස **නොසැලකූ** කලා මාධ්‍යය වන්නේ,
(1) සංගීතයයි.
(2) චිත්‍ර කලාවයි.
(3) අභිනයන කලාවයි.
(4) ගෘහ නිර්මාණ ශිල්පයයි.
(5) මූර්ති ශිල්පයයි.

**13.** ශක්තිය නික්මෙන මූල පිළිබඳව අදහස් දැක් වූ විද්‍යාඥයා වන්නේ,
(1) චාල්ස් ඩාවින් ය.
(2) සර් අයිසෙක් නිව්ටන් ය.
(3) තෙයියාර් ඩි ෂාර්ඩැන් පියතුමා ය.
(4) ඇල්බට් අයින්ස්ටයින් ය.
(5) ආර්කිමීඩිස් ය.

**14.** බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ආපසු ජෙරුසලමට පැමිණි ඊශ්‍රායෙල් ජාතික කුමාරයා වන්නේ,
(1) ඒස්රා ය.
(2) නෙහෙමියා ය.
(3) ජොසියා ය.
(4) සෙරුබාබෙල් ය.
(5) සකරියා ය.

**15.** නෙස්ටෝරියන් වේදභේදය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ක්‍රිස්තුන් වහන්සේ තුළ දේවත්වය නැත.
(2) මරියතුමිය දෙවියන් වහන්සේගේ මව නොවේ.
(3) ක්‍රිස්තුන් වහන්සේ තුළ ස්වභාවයන් දෙකක් වෙන වෙනම පිහිටා ඇත.
(4) ක්‍රිස්තුන් වහන්සේට ඇත්තේ මවා ගත් ශරීරයක් පමණි.
(5) පුත්‍රයාණන් වහන්සේ පියාණන් වහන්සේ විසින් මවනු ලැබූවෙකි.

**16.** මැනිකිවාදය තුළ අඩංගු **නොවන** ප්‍රකාශය කුමක් ද?
(1) ආලෝකය සහ අන්ධකාරය වශයෙන් රාජ්‍යයන් දෙකකි.
(2) ආලෝකයේ රාජ්‍යය දෙවියන් වහන්සේ සතු ය.
(3) අඳුරේ රාජ්‍යය යක්ෂයා සතු ය.
(4) ආලෝකය සහ අන්ධකාරය යන බලවේග දෙකම සදාකල් පවතිනු ඇත.
(5) යක්ෂයා විසින් ආදම් මවන ලදී.

**17.** ස්ලාව් ජාතීන් අතර කිතු දහම පැතිරවීමට පෙරමුණ ගත්තේ,
(1) ශාන්ත සිරිල් සහ ශාන්ත මෙතෝදියස් යන දෙදෙනා ය.
(2) අයිඩන් නමැති තාපසතුමන් ය.
(3) ස්කොට්ලන්තයේ අපෝස්තුලුවරයා ලෙස සැලකෙන කොලොම්බන්තුමන් ය.
(4) ස්කැන්ඩිනේවියාවේ ශාන්ත අනෙස්කා තාපසතුමන් ය.
(5) ශාන්ත බොනිපස්තුමන් ය.

**18.** "ශුද්ධ වූ සභාව අයර්ලන්තය තුළ වේගයෙන් ප්‍රචාරය වීමට නම් අයර්ලන්ත ජනතාව ඉදිරියට පැමිණිය යුතු ය." මෙසේ ප්‍රකාශ කළේ,
(1) ශාන්ත මහා ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා ය.
(2) ශාන්ත කොළොම්බන්තුමා ය.
(3) කැන්ටබරියේ ශාන්ත අගුස්තීනුතුමා ය.
(4) ශාන්ත පැට්‍රික්තුමා ය.
(5) ජර්මනියේ අපෝස්තුලුවරයා වන බෙනඩික්තුමා ය.

**19.** කුරුස යුද්ධය ඇතිවීමට හේතුව වූයේ,
(1) ඉස්ලාම් භක්තිකයන් විසින් කුරුසියට අවමාන කිරීම ය.
(2) මුස්ලිම් හමුදා යුරෝපය ආක්‍රමණය කිරීම ය.
(3) තුර්කි මුස්ලිම්වරුන්ගෙන් ශුද්ධ වූ දේශය මුදා ගැනීම ය.
(4) මුස්ලිම් හමුදා විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම වැලැක්වීම ය.
(5) රෝම අධිරාජ්‍යයේ බලය තවදුරටත් ව්‍යාප්ත කරවීම ය.

**20.** ආශ්‍රමික තාපස ජීවිතය ගොඩනැගීමට දායකත්වය දුන් තිදෙනෙකු ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ශාන්ත ඇතනේෂියස්තුමා, ශාන්ත හිප්පෝ අගුස්තීනුතුමා හා ශාන්ත බෙනඩික්තුමා
(2) ශාන්ත හිප්පෝ අගුස්තීනුතුමා, ශාන්ත පකෝමියස්තුමා හා ශාන්ත බැසිල්තුමා
(3) ශාන්ත බෙනඩික්තුමා, ඊජිප්තුවේ ශාන්ත අන්තෝනිතුමා හා ශාන්ත හිප්පෝ අගුස්තීනුතුමා
(4) ශාන්ත ඇතනේෂියස්තුමා, ශාන්ත පකෝමියස්තුමා හා ශාන්ත බැසිල්තුමා
(5) ශාන්ත බෙනඩික්තුමා, ඊජිප්තුවේ ශාන්ත අන්තෝනිතුමා හා ශාන්ත බැසිල්තුමා

**21.** ක්ලූනි තාපස ක්‍රමයෙන් බිහි වූ විශිෂ්ඨ පුද්ගලයන් තිදෙනෙකු වන්නේ,
(1) ශාන්ත බෙනඩික්තුමා, ශාන්ත බර්නාඩ්තුමා හා ශාන්ත පැට්‍රික්තුමා ය.
(2) ශාන්තා බර්නාඩ්තුමා, ශාන්ත හියුතුමා හා ශාන්ත බැසිල්තුමා ය.
(3) ශාන්ත හියුතුමා, ශාන්ත රොමොල්ඩ්තුමා හා ශාන්ත පීටර් ඩේමියන්තුමා ය.
(4) ශාන්ත රොමොල්ඩ්තුමා, ශාන්ත පැට්‍රික්තුමා හා ශාන්ත කොලොම්බන්තුමා ය.
(5) ශාන්ත පීටර් ඩේමියන්තුමා, ශාන්ත කොලොම්බන්තුමා හා ශාන්ත ග්‍රෙගරිතුමා ය.

**22.** 1850 සිට 1900 කාලය තුළදී යුරෝපයේ සිට ශ්‍රී ලංකාවේ සේවාව සඳහා පැමිණි කාන්තා පැවිදි පන්ති වන්නේ,
(1) ශුද්ධ වූ පවුලේ පැවිදි පන්තිය, අපෝස්තලික කාර්මෙල් පැවිදි පන්තිය හා ශුද්ධ වූ කුරුසියේ පැවිදි පන්තියයි.
(2) යහපත් එඬේරාගේ පැවිදි පන්තිය, දේව සංරක්ෂණයේ පැවිදි පන්තිය හා දොමිනිකාන සොහොයුරියන්ගේ පැවිදි පන්තියයි.
(3) ප්‍රැන්සිස්කාන පැවිදි පන්තිය, ශුද්ධ වූ පවුලේ පැවිදි පන්තිය හා ශුද්ධ වූ කුරුසියේ පැවිදි පන්තියයි.
(4) ශුද්ධ වූ පවුලේ පැවිදි පන්තිය, යහපත් එඬේරාගේ පැවිදි පන්තිය හා ප්‍රැන්සිස්කාන පැවිදි පන්තියයි.
(5) දයාවේ පැවිදි පන්තිය, අපෝස්තලික කාර්මෙල් පැවිදි පන්තිය හා දේව සංරක්ෂණයේ පැවිදි පන්තියයි.

**23.** මානව අයිතීන් සුරැකීම සම්බන්ධයෙන් කැප වූ තිදෙනෙකු ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ලියෝ නානායක්කාර රදගුරුතුමා, එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා, මයිකල් රොද්‍රිගු පියතුමා
(2) තිස්ස බාලසූරිය පියතුමා, ස්වාමි ඥාණප්‍රගාසම් පියතුමා, එවිලින් කානි මැතිනිය
(3) ගරු ලියෝ නානායක්කාර රදගුරුතුමා, පීටර් පිල්ලේ පියතුමා, දොන් පීටර් පියතුමා
(4) ලියෝ නානායක්කාර රදගුරුතුමා, ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා, මයිකල් රොද්‍රිගු පියතුමා
(5) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා, පීටර් පිල්ලේ පියතුමා, දොන් පීටර් පියතුමා

**24.** පෘතුගීසි සමයේ සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ සැකසූ පියතුමන්ලා දෙදෙනා කවුරුන් ද?
(1) එම්මැනුවෙල් කොස්තා සහ පියෙරෙ බෙර්ගුවින්
(2) එම්මැනුවෙල් කොස්තා සහ අන්තෝනියෝ පෙක්ෂේචෝ
(3) පියෙරෙ බෙර්ගුවින් සහ ජාකොමේ ගොන්සාල්වෙස්
(4) ජාකොමේ ගොන්සාල්වෙස් සහ අන්තෝනියෝ පෙක්ෂේචෝ
(5) සෙබස්තියන් පොන්සේ සහ පියෙරෙ බෙර්ගුවින්

**25.** බ්‍රිතාන්‍ය පාලන සමයේ බිහි වූ දෙමළ කිතුනු සඟරා දෙකක් වන්නේ,
(1) පාදුකාවලන් හා ඥාණපල්ලු ය.
(2) උදය තාරකෙ හා සන්දියාගු මයෝ අම්මානෙ ය.
(3) ඥාණපල්ලු හා නාලු වේදම් ය.
(4) උදය තාරකෙ හා පදුකාවලන් ය.
(5) සන්දියාගු මයෝ අම්මානෙ හා නාලු වේදම් ය.

**26.** එංගලන්තයේ VIII වන හෙන්රි රජතුමා විසින් හිස ගසා මරාදමනු ලැබූ කතෝලික නීතිඥවරයා වන්නේ,
(1) තෝමස් ක්‍රෑන්මර් ය. (2) තෝමස් බිල්නි ය. (3) විලියම් ටින්ඩේල් ය.
(4) තෝමස් විලියම් ය. (5) තෝමස් මුවර් ය.

**27.** විලියම් කේරිතුමන් ඇතුළත් වන පොතෙස්තන්ත සභාව වන්නේ,
(1) මෙතෝදිස්ත සභාව ය. (2) ඇන්ග්ලිකන් සභාව ය.
(3) දකුණු ඉන්දියානු සභාව ය. (4) බැප්ටිස්ට් සභාව ය.
(5) ලූතරන් සභාව ය.

**28.** ජේසු නිකාය ආරම්භ කරනු ලැබුයේ,
(1) ශාන්ත ඉග්නේෂියස් ලොයෙලාතුමා විසිනි.
(2) ශාන්ත ප්‍රැන්සිස් ක්ෂාවියර්තුමා විසිනි.
(3) කුරුසියේ ශාන්ත ජුවාම්තුමා විසිනි.
(4) ඇසීසියේ ශාන්ත ප්‍රැන්සිස්තුමන් විසිනි.
(5) ශාන්ත පීටර් ඩේමියන්තුමා විසිනි.

**29.** ක්‍රිස්තියානි එකමුතු සතිය පැවැත්වීමට මුලපිරුවේ,
(1) විලියම් කේරිතුමා ය.
(2) පියා කාදිනල්තුමා ය.
(3) 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.
(4) 6 වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා ය.
(5) පෝල් වොට්සන්තුමා ය.

**30.** සමාජ ප්‍රගතිය පිළිබඳව අදහස් දක්වන දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශය කුමක් ද?
(1) ක්‍රිස්තියානි නොවන ආගම් කෙරෙහි සබඳතාව පිළිබඳ ප්‍රකාශය - නොස්ට්‍රා අයිටාටෙ
(2) වර්තමාන ලෝකය තුළ ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශය - ගවුඩියුම් ඒට් ස්පෙස්
(3) ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශය - ලුමෙන් ජෙන්සියුම්
(4) ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශය - ඩිග්නිටාටිස් හුමානෙ
(5) දේව ප්‍රකාශනය පිළිබඳ ව්‍යවස්ථාව - ඩෙයි වර්බුම්

**31.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පැවැත්වෙද්දී ගිහියන්ට මූලිකත්වය දුන් දේවධර්ම ශාස්ත්‍රඥයා වන්නේ,
(1) කාර්ල් රාහ්නර්තුමා ය. (2) බෙයා කාදිනල්තුමා ය.
(3) ඊව්ස් කොන්ගාතුමා ය. (4) ජෝශප් රට්සින්ගර් කාදිනල්තුමා ය.
(5) XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.

**32.** බයිබලයේ 'වුල්ගාතා' හෙවත් 'වල්ගේට්' යන ලතින් පරිවර්තනය සිදු කරන ලද්දේ,
(1) ශාන්ත බැසිල්තුමා විසිනි. (2) ශාන්ත අගුස්තීනුතුමා විසිනි.
(3) ශාන්ත ජස්ටින්තුමා විසිනි. (4) ශාන්ත ඇතනේෂියස්තුමා විසිනි.
(5) ශාන්ත ජෙරොම්තුමා විසිනි.

**33.** ක්‍රිස්තියානි තාපස නිකාය ආරම්භ වූ මුල් රටවල් දෙක මොනවා ද?
(1) ඊජිප්තුව සහ සිරියාව (2) සිරියාව සහ පලස්තීනය
(3) ඊජිප්තුව සහ මෙසපොතේමියාව (4) පලස්තීනය සහ පර්සියාව
(5) සිරියාව සහ කොන්ස්තන්තිනෝපලය

**34.** පුරාණ ගිවිසුමේ සඳහන් **නොවන** කොටස වන්නේ,
(1) ඓතිහාසික හැඳින්වීම ය.
(2) අධිරාජයාගේ හෝ බලගතු රජතුමකුගේ ඓතිහාසික යහපත් ක්‍රියාවක් විස්තර කිරීම ය.
(3) ගිවිසුමට යටත්වන්නාගේ වගකීම පැහැදිලි කිරීම ය.
(4) දෙවිවරුන්ගේ නාම ලේඛනයක් ඇතුළත් කර තිබීම ය.
(5) ගිවිසුම බලපවත්නා කාලය සඳහන් කිරීම ය.

**35.** ඊශ්‍රායලීය රාජකීය සංස්ථාව බිහි වීමට හේතුවක් **නොවන්නේ**,
(1) විනිශ්චයකාරවරුන්ගේ අදක්ෂතාව ය.
(2) දේවමාලිගයේ වතාවත් අධීක්ෂණය කිරීම ය.
(3) ජාතික අනන්‍යතාවයක් ඇති කර ගැනීම ය.
(4) හමුදාවන්ට නායකත්වය දීම ය.
(5) අසල්වැසි සියලු රටවල් රජවරුන් විසින් පාලනය කිරීම ය.

AL/2018/49/S-I

**36.** ඓතිහාසික සිද්ධීන්වලට අදාළ පහත සඳහන් වගන්ති අතුරෙන් නිවැරදි වගන්ති තෝරන්න.

A - පෘතුගීසීන් විසින් කොළඹ බඩු ගබඩාවක් සහ දේවස්ථානයක් ගොඩනගන ලදී.

B - පෘතුගීසීන් විසින් දේවස්ථානය ශුද්ධ වූ ලෝරන්ස්තුමන්ට කැප කරන ලදී.

C - මායාදුන්නේ රජතුමා සීතාවක රාජ්‍යය පාලනය කළේ ය.

D - මායාදුන්නේ රජතුමා විසින් ධර්මපාල කුමරාව තමාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් පත් කිරීමට පෘතුගීසීන්ගේ සහාය පැතී ය.

E - VII වන බුවනෙකබාහු රජතුමා තමාගේ වැසියන්, කිතු දහම වැළඳ ගැනීමට ධෛර්යමත් කළේ ය.

(1) A සහ D (2) A සහ E (3) B සහ C (4) B සහ D (5) C සහ D

**37.** පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් කුරුසියේ ශුද්ධ වූ ජුවාම්තුමා විසින් රචනා කරන ලද ග්‍රන්ථ මොනවා ද?

A - ප්‍රේමයේ ජීවමාන ගිනිදැල්ල - The Living Flame of Love

B - අධ්‍යාත්මික ගීතය - The Spiritual Canticle

C - කාර්මෙල් කඳු නැගීම - Ascent of Mount Carmel

D - පදනම - The Foundation

E - ඇතුළාන්තර මන්දිරය - Interior Castle

(1) A, B සහ C (2) A, B සහ E (3) A, D සහ E (4) B, C සහ D (5) C, D සහ E

**38.** ශ්‍රී ලංකාවේ මෙතෝදිස්ත සභාවට සම්බන්ධ සේවාවක් **නොවන්නේ,**

(1) අධ්‍යාපන සේවාවයි.

(2) සෞඛ්‍ය සේවාවයි.

(3) අනාථ මඩම් පිහිටුවීමයි.

(4) සංවර්ධනය නොවූ ප්‍රදේශ සංවර්ධනය කිරීමයි.

(5) මන්නාරම් ප්‍රදේශය තුළ විශාල සේවාවක් සිදු කිරීමයි.

**39.** ශ්‍රී ලංකාවේ, බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයකු වන තෝමස් මෙට්ලන්ඩ් සිදු කළ වැදගත් ම සේවාව වන්නේ,

(1) මුළු ශ්‍රී ලංකාව පුරා පාසල් පිහිටුවීම ය.

(2) ආගමික නිදහස ඇති කිරීම ය.

(3) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීම ය.

(4) ආගම පැතිරවීම සඳහා ධර්මදූත කණ්ඩායම් ගෙන්වා ගැනීම ය.

(5) විධිමත් අධ්‍යාපනය අනිවාර්ය කිරීම ය.

**40.** ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරු කුලය සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වයට වඩා මනුෂ්‍යත්වයට ප්‍රමුඛත්වය දී ඇත.

(2) ඉගැන්වීම්වලදී ප්ලේටෝගේ දර්ශන ක්‍රම උපයෝගී කර ගෙන ඇත.

(3) ක්‍රිස්තුවේදය සඳහා ජොහාන් සුවිශේෂය පාදක කොට ගෙන ඇත.

(4) ශුද්ධ වූ ලියවිලි ව්‍යංගාර්ථයෙන් ඉදිරිපත් කර ඇත.

(5) ශුද්ධ වූ බයිබලය විවරණයේදී ඓතිහාසික කරුණුවලට වඩා ව්‍යාකරණ රටාවට මුල් තැන දී ඇත.

**41.** පහත සඳහන් කරුණු අතුරෙන් ශාන්ත බැසිල්තුමා හඳුන්වා දුන් තාපස නීතිමාලාවට ඇතුළත් කරුණු පමණක් දැක්වෙන වරණය කුමක් ද?

A - තාපසයන් එක වහලක් යට ජීවත්විය යුතුයි.

B - තාපසයන් පොදු කාල සටහනකට අනුව දිවි ගෙවිය යුතුයි.

C - තාපසයන් ශාරීරික වෙහෙස යොදවා වැඩ කළ යුතුයි.

D - තමාට රුචි පරිදි තාපසයන්ට හුදකලාව කුටි තුළ යාච්ඤා කිරීමට අවසර තිබිය යුතුයි.

E - සතියකට දෙවරක් සියලු තාපසයන් එකට එක්වී තම අත්දැකීම් බෙදාගත යුතුයි.

(1) A, B සහ C (2) A, B සහ D (3) A, B සහ E (4) B, C සහ D (5) B, C සහ E

**42.** ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සමාජීය සහ දයාවේ සේවාව සඳහා කැප වූ කිතුනු ආයතන තුනක් වන්නේ,

(1) ශ්‍රී ලංකා කරිටාස්-සෙඩෙක් ආයතනය, ශාන්ත විසෙන්ති ද පාවුලා සමිතිය හා තරුණ ක්‍රිස්තියානි සංගමයයි.

(2) තරුණ ක්‍රිස්තියානි සංගමය, මරිය හමුදාව හා ශාන්ත විසෙන්ති පාවුලා සමිතියයි.

(3) දිව්‍ය හෘදයේ සමාගම, තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය හා ශ්‍රී ලංකා කරිටාස්-සෙඩෙක් ආයතනයයි.

(4) ශාන්ත විසෙන්ති ද පාවුලා සමිතිය, මරිය හමුදාව හා දිව්‍ය හෘදයේ සමාගමයි.

(5) ශ්‍රී ලංකා කරිටාස්-සෙඩෙක් ආයතනය, ළමා ධර්මදූත සමාජය හා කිතුණු කම්කරු ව්‍යාපාරයයි.

**43.** පහත සඳහන් ආයතන අතුරෙන් අධ්‍යාපනය, සංවාදය සහ සමාජීය කටයුතු වෙනුවෙන් මූලික ලෙස කැප වී ඇති ශ්‍රී ලංකාවේ කිතුනු ආයතන තුනක් දැක්වෙන වරණය කුමක් ද?

A - තුලන ආයතනය
B - සුබෝධි පූර්ණ අධ්‍යාපන ආයතනය
C - ශ්‍රී ලංකා කරිටාස් - සෙඩෙක් ආයතනය
D - සමාජීය සහ සාමයික ආයතනය (CSR)
E - කතෝලික ලේඛක සංගමය

(1) A, B සහ D (2) A, B සහ E (3) A, C සහ D (4) B, C සහ D (5) B, D සහ E

**44.** මානව අයිතීන් සුරැකීම සම්බන්ධයෙන් සභාව කැපවිය යුතු වන්නේ පහත සඳහන් කරුණු අතුරෙන් කුමන කරුණු මුල් කොට ගෙන ද?

A - මිනිසා දෙවියන් වහන්සේගේ සමානකමට හා ස්වරූපයට මැවූ උතුම් මැවිල්ලක් වීම
B - දෙවියන් වහන්සේම මනුෂ්‍යත්වය ගෙන මනුෂ්‍යයාගේ උතුම්කම පෙන්වා දීම
C - මනුෂ්‍යයන්ගෙන් ලෝකය හිස් වුවහොත් ලෝකය රැක බලා ගැනීමට කිසිවකු නැති වීම
D - මනුෂ්‍යයාට හිමි ගෞරවය රැක දීම හා සාධාරණත්වය ඉෂ්ට කිරීම
E - මනුෂ්‍යයන් තුළ අනෙක් සත්ත්වයනට හිමි නොවූ ඥාණය සහ නිදහස් කැමැත්ත තිබීම

(1) A, B සහ C (2) A, B සහ D (3) A, B සහ E (4) A, D සහ E (5) B, C සහ D

**45.** පහත සඳහන් වැකි සලකන්න.

A - පෘතුගීසී පාලන සමයේදී මෙරට ආරෝග්‍යශාලා තිබූ බව සඳහන් වේ.
B - ආගම් භේදයකින් තොරව සැමට ප්‍රතිකාර කළ ආරෝග්‍යශාලා දෙකක් ධර්මදූතවරුන් විසින් මන්නාරමේ පිහිටුවනු ලැබූහ.
C - වසංගත රෝග සම්බන්ධයෙන් තිබූ බිය නිසා ආරෝග්‍යශාලා බොහොමයක් වසා දැමීමට ධර්මදූතවරුන්ට සිදු විය.
D - මහනුවර ඇති වූ වසංගත සමයේදී ජුසේවාස්තුමන් එම රෝගීන්ට උපස්ථාන කිරීමේ නිරත වූයේ ය.
E - නිතර පැතිරුණු වසංගත රෝග නිසා ධර්මදූතවරුන් ශ්‍රී ලංකාවට පැමිණීමට බිය වූහ.

ඉහත සඳහන් වැකි අතුරෙන් විදේශීය පාලන සමයේදී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය සම්බන්ධ නිවැරදි වගන්ති මොනවා ද?

(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**46.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට සම්බන්ධ ශුද්ධෝත්තම පියතුමන්ලා දෙදෙනා වන්නේ,

(1) 12 වන පියුස් පාප්තුමා සහ 23 වන ජුවාම් පාප්තුමා ය.
(2) 23 වන ජුවාම් පාප්තුමා සහ I වන ජුවාම් පාවුලු පාප්තුමා ය.
(3) 6 වන පාවුලු පාප්තුමා සහ I වන ජුවාම් පාවුලු පාප්තුමා ය.
(4) 6 වන පාවුලු පාප්තුමා සහ II වන ජුවාම් පාවුලු පාප්තුමා ය.
(5) 23 වන ජුවාම් පාප්තුමා සහ 6 වන පාවුලු පාප්තුමා ය.

**47.** පහත සඳහන් වගන්ති අතුරෙන් එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමන්ට අදාළ **නොවන** වගන්තිය කුමක් ද?

(1) එතුමා පළමු සිංහල රදගුරුතුමන් ය.
(2) දේශීය සභාවක් ගොඩනැංවීම සඳහා එතුමා මහත් පරිශ්‍රමයක් දැරී ය.
(3) එතුමා දර්ශනවාදය සහ දේවධර්මය පිළිබඳ විශාරදයෙකි.
(4) එතුමා ලන්ඩන් විශ්වවිද්‍යාලයේදී බටහිර භාෂා පිළිබඳ නිපුණත්වයක් ලැබී ය.
(5) එතුමා දේව වන්දනාව ගැන මහත් උනන්දුවක් දැක් වූ අතර සිංහල ගීතිකා ද රචනා කළේ ය.

**48.** පහත සඳහන් වගන්ති අතුරෙන් අලිසියේරි ඩාන්ටේට සම්බන්ධ **නොවන** වගන්තිය කුමක් ද?

(1) ඔහු ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයේ උපන්නේ ය.
(2) ඔහු ක්‍රිස්තියානි සාහිත්‍යය ගොඩනැංවීමට මහත් සේ දායක වූයේ ය.
(3) ඔහු ග්‍රීක භාෂාවෙන් ලියා ඇති ග්‍රන්ථ, ලතින් භාෂාවට පරිවර්තනය කළේ ය.
(4) ඔහු කාව්‍ය ග්‍රන්ථ තම මව්බස වූ ඉතාලි භාෂාවෙන් නිර්මාණය කළේ ය.
(5) 'දේව සුධාන්තය' (Divine Comedy) ඔහු විසින් ලියන ලද විශිෂ්ටතම ග්‍රන්ථය ලෙස සලකයි.

**49.** ජෝන් කැල්වින්තුමන් විසින් සම්පාදනය කරන ලද 'කිතුනු ආගමික සත්‍යතාවයන්' නමැති ග්‍රන්ථයේ සඳහන් **නොවන** කරුණු ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ලෝකය මැවුම්කාර දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ ලබා දෙන ගැලවීම, ශුද්ධාත්මයාණන් වහන්සේ හා ශුද්ධ වූ සභාව
(2) ලෝකය මැවුම්කාර දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ ලබා දෙන ගැලවීම, ස්වර්ගීය ජීවිතය හා නිරය
(3) ලෝකය මැවුම්කාර දෙවියන් වහන්සේ, ශුද්ධ වූ ත්‍රිත්වය, ක්‍රිස්තුන් වහන්සේගේ ගුණාංග හා ශුද්ධාත්මයාණන් වහන්සේ
(4) ශුද්ධ වූ ත්‍රිත්වය, ශුද්ධාත්මයාණන් වහන්සේ, ශුද්ධ වූ සභාව හා නිරය
(5) ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ ලබා දෙන ගැලවීම, ක්‍රිස්තුන් වහන්සේගේ ගුණාංග, ශුද්ධ වූ වන්දනාව හා මරියෝත්තමාවෝ

**50.** ඉන්දියාවට කිතු දහම ගෙන ආ අපෝස්තුලුතුමන් වශයෙන් සලකන්නේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ පිලිප් අපෝස්තුලුතුමා
(2) ශුද්ධ වූ බර්තලොමියුස් අපෝස්තුලුතුමා
(3) ශුද්ධ වූ ජූඩ් තදේයුස් අපෝස්තුලුතුමා
(4) ශුද්ධ වූ තෝමස් අපෝස්තුලුතුමා
(5) ශුද්ධ වූ ඇන්ඩෘ අපෝස්තුලුතුමා

* * *

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம்: **49**

විෂයය / பாடம்: **ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 3 | 31. | 3 | 41. | 1 |
| 02. | 5 | 12. | 5 | 22. | 4 | 32. | 5 | 42. | 1 |
| 03. | 3 | 13. | 4 | 23. | 4 | 33. | 1 | 43. | open |
| 04. | 1 | 14. | 4 | 24. | 1 | 34. | 5 | 44. | 2 |
| 05. | 2 | 15. | 2 | 25. | 4 | 35. | 2 | 45. | 2 |
| 06. | 3 | 16. | 4 | 26. | 5 | 36. | 3 | 46. | 5 |
| 07. | 1 | 17. | 1 | 27. | 4 | 37. | 1 | 47. | 3 |
| 08. | 4 | 18. | 4 | 28. | 1 | 38. | 5 | 48. | 3 |
| 09. | 5 | 19. | 3 | 29. | 5 | 39. | 2 | 49. | 5 |
| 10. | 3 | 20. | 4 | 30. | 2 | 40. | 1 | 50. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

2018.08.07 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**
* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) ශුද්ධ වූ ජස්ටින්තුමාගේ ජීවිතය පිළිබඳව කරුණු **හතරක්** ලියන්න.
(ii) ග්‍රීක සභා පිතෘන් **දෙදෙනෙකුගේ** හා ලතින් සභා පිතෘන් **දෙදෙනෙකුගේ** නම් ලියන්න.
(iii) මුල් සභාවේ දේව ධර්මීය වර්ධනය සඳහා සභා පිතෘන් විසින් සිදු කළ සේවා **හතරක්** ලියන්න.
(iv) තාපස ක්‍රමය ආරම්භක අවධියේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
(v) කාන්තාරයේ පියවරුන්ගේ ජීවිතයේ දක්නට තිබූ විශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

**2.** (i) මධ්‍යතන යුගයේ සභාවේ ලක්ෂණ **හතරක්** ලියන්න.
(ii) මධ්‍යතන යුගයේදී සභාවේ ප්‍රතිසංස්කරණයට හේතු වූ ආගමික පසුබිම පිළිබඳ කරුණු **හතරක්** සඳහන් කරන්න.
(iii) ක්ලුනි තාපස ක්‍රමයේ දක්නට තිබූ ආධ්‍යාත්මික ලක්ෂණ **හතරක්** ලියන්න.
(iv) යාචක නිකා බිහිවීමට හේතු වූ කරුණු **හතරක්** ලියන්න.
(v) සභාවට හා සමාජයට ශිෂ්ටර්ෂියන් තාපසවරුන්ගෙන් සිදු වූ සේවා **හතරක්** සඳහන් කරන්න.

**3.** (i) මැතිව් රිචි පියතුමාගේ ධර්මදූත ක්‍රියාවලියේ තිබූ විශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
(ii) 18 හා 19 වන ශත වර්ෂවලදී චීනයේ සභාව මුහුණ දුන් අභියෝග **හතරක්** ලියන්න.
(iii) ශාන්ත ප්‍රැන්සිස් ක්ෂේවියර්තුමාගේ කාලයේ සිට ජපානය තුළ කිතු දහම ප්‍රචලිත කිරීම සඳහා උපයෝගී කරගත් ක්‍රියාමාර්ග **හතරක්** දක්වන්න.
(iv) 16 හා 17 වන ශත වර්ෂවලදී පෘතුගීසි ධර්මදූතවරුන් ශ්‍රී ලංකාව තුළ දී මුහුණ දුන් අභියෝග **හතරක්** සඳහන් කරන්න.
(v) පළමුවරට පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට ශ්‍රී ලංකාව තුළ තිබූ රාජධානි **දෙකක්** හා ඒවායේ රජවරුන්ගේ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

## II කොටස

**4.** සෑම කිතුනුවකුගෙන්ම නිවැරදි ජීවිත මාර්ගයක් හා යාගික කැපවීමක් බලාපොරොත්තු වන නිසා කිතුනු ශ්‍රාවකත්වය අභියෝගාත්මක එකකි.
(i) ශුද්ධ වූ මැතිව්තුමන් විසින් ලියූ ශුද්ධ වූ ශුවිශේෂයේ සඳහන් වන ආකාරයට භාග්‍ය අට තුළ හමුවන අභියෝගාත්මක කරුණු මොනවා දැ'යි සඳහන් කරන්න.
(ii) "කිතුනු ජීවිතයට ක්‍රිස්තුන් වහන්සේගේ බැහැපත්කම අභියෝගාත්මක ආදර්ශයකි." සාකච්ඡා කරන්න.
(iii) නූතන කිතුනු සමූහයන්ට මුල් කිතුනුවන්ගේ සාංඝික ජීවිතය අභියෝගාත්මක විය හැකි වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න.
(iv) "බෙනඩික්ටන් තාපස ජීවිතය කිතුනු ශ්‍රාවකත්වයේ අභියෝගාත්මක කරුණු සම්බන්ධයෙන් සාක්ෂි දරයි." සාකච්ඡා කරන්න.

5. යුරෝපීය ගෝත්‍රයන්ගේ ක්‍රමානුකූල සිත්හැරීම, සභාවේ වර්ධනය සඳහා විවිධාකාර ලෙස උපකාරී වී ඇත.
(i) යුරෝපීය ගෝත්‍ර ක්‍රමානුකූල ලෙස කිතු දහම වැළඳ ගැනීමට හේතු මොනවා දැ'යි පැහැදිලි කරන්න.
(ii) අයර්ලන්තය කිතු දහම වැළඳ ගැනීමේදී ශුද්ධ වූ පැට්‍රික්තුමන්ගේ දායකත්වය අගයන්න.
(iii) නමවන ශත වර්ෂය එළඹෙන විට, යුරෝපයේ සියලු ගෝත්‍ර කිතු දහම වැළඳ ගැනීම යුරෝපීය සමාජයේ ඉක්මන් සංවර්ධනයට බලපෑ ආකාරය පැහැදිලි කරන්න.
(iv) සභාවේ වර්ධනය සඳහා මහා චාල්ස් අධිරාජයාගෙන් සිදු වූ සේවාව පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

6. ක්‍රිස්තියානි ඉගැන්වීම් හා වටිනාකම් ප්‍රකාශ කිරීමේදී ක්‍රිස්තියානි කලා මාධ්‍ය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත.
(i) මුල් කාලයේදී කිතුනු ආගමික චිත්‍ර කිතුනු ඇදහිල්ලට හා සංකේතාත්මක සන්නිවේදනයට දායක වී ඇති ආකාරය විස්තර කරන්න.
(ii) රෝමානු ශෛලියේ කලා නිර්මාණ තුළ දක්නට ඇති විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.
(iii) ප්‍රෙස්කෝ චිත්‍රවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා දැ'යි දක්වන්න.
(iv) සාධනීය කිතුනු ධර්මෝපදේශයක් බිහි කිරීම සම්බන්ධයෙන් කිතුනු කලාවේ විශේෂිත දායකත්වය කුමක් දැ'යි පැහැදිලි කරන්න.

7. බ්‍රිතාන්‍ය පාලන සමයේදී කිතු දහම ශ්‍රී ලංකා සමාජයේ යහපත උදෙසා සැලකිය යුතු සේවාවක් සිදු කර ඇත.
(i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නගාලීම සඳහා ප්‍රොතෙස්තන්ත ධර්මදූතවරුන්ගේ දායකත්වය කෙසේ දැ'යි පැහැදිලි කරන්න.
(ii) බ්‍රිතාන්‍ය පාලන සමයේදී ප්‍රොතෙස්තන්ත ධර්මදූතවරුන් විසින් සිදු කරන ලද දයාවේ සේවාවන් පිළිබඳව විස්තර කරන්න.
(iii) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී කතෝලිකයින් විසින් අත්දුටු වාසි හා අවාසි මොනවා දැ'යි පැහැදිලි කරන්න.
(iv) බ්‍රිතාන්‍ය පාලන සමයේදී ශ්‍රී ලාංකික සමාජය වෙත බලපෑ කිතුනු වටිනාකම් පිළිබඳව විස්තර කරන්න.

8. සභාවේ ඉගැන්වීම් මගින් සමාජය තුළ සාමය සහ සංහිඳියාව නංවාලීමට හැකි විය.
(i) ආසියානු රදගුරු සමුළු සම්මේලනයේ (FABC) ආරම්භය සහ විකාශනය පිළිබඳව විස්තර කරන්න.
(ii) ආසියානු රදගුරු සමුළු සම්මේලනය මගින් සාමය සහ සංස්කෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ඉගැන්වීම් පැහැදිලි කරන්න.
(iii) ජගත් කිතුනු සභා සම්මේලනය (WCC) මගින් සාමය සහ කිතුනු සභා එකමුතුව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ඉගැන්වීම් පිළිබඳ විස්තර කරන්න.
(iv) ශ්‍රී ලංකා සමාජයේ ඇති විවිධ ගැටුම් හමුවේ සාමය සහ සංහිඳියාව ඇති කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔබගේ අදහස් පැහැදිලි කරන්න.

***

## II කොටස

## I කොටස

01. (i) **ශුද්ධ වූ ජස්ටින්තුමන්ගේ ජීවිතය පිළිබඳව කරුණු හතරක් ලියන්න.**

- ක්‍රිස්තියානි සහා ඉතිහාසයේ ප්‍රථම මහා ලේඛකයා ලෙස සැලකෙයි.
- එතුමන් පලස්තීනයේ උපත ලැබීය.
- ශාන්ත ජස්ටින්තුමා ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙකි.
- ඇපලෝජියාව නමැති ග්‍රන්ථය එතුමා ලියා ඇති ග්‍රන්ථ අතරින් ප්‍රධානතම/ ශ්‍රේෂ්ඨතම ග්‍රන්ථය ලෙස සැලකෙයි.
- රෝමයේ පැවතුන යුකිරිස්තීය හෙවත් ස්තොත්‍ර පූජාව ඇපලොජියාව ග්‍රන්ථයේ තේමාව කොට ගෙන ඇත.
- ක්‍රි.ව.165 දී පමණ සිරභාරයට ගත් ශාන්ත ජස්ටින්තුමාව මාකස් අවුරේලියස් අධිරාජ්‍යයාගේ පාලන සමයේ දී හිස ගසා මරා දමනු ලැබීය.

ii. **ග්‍රීක සභා පීතෘන් සහ ලතින් සභා පීතෘන් දෙදෙනෙකුගේ නම් ලියන්න.**

**ග්‍රීක සභා පිතෘහු**

ඔරිගන් තුමා

ඇලෙක්සැන්ඩ්‍රි ටර්ටුලියන් තුමා

ශාන්ත මහා බැසිලි තුමා

ශාන්ත ඉරේනිස් තුමා

ශාන්ත ජෝන් ක්‍රිසොස්කොම් තුමා

ශාන්ත නිස්සාහි ග්‍රෙගරි තුමා

ශාන්ත ඉග්නේසියුස් තුමා

ශාන්ත අතනාසියුස් තුමා

**රෝම සභා පිතෘහු**

ශාන්ත ජෙරොම්තුමා

ශාන්ත අම්බ්‍රෝසිතුමා

ශාන්ත ඔගස්ටින් තුමා

ශාන්ත මහා ග්‍රෙගරිතුමා

ටර්ටලියන්තුමා

ශාන්ත ජස්ටින්තුමා

ශාන්ත ඉලාරියුස් තුමා

ශාන්ත සිරිල් තුමා (රෝමය)

iii. මුල් සභාවේ දේව ධර්මීය වර්ධනය සඳහා සභා පිතෘන් විසින් සිදු කළ සේවාව පිළිබඳ කරුණු හතරක් ලියන්න.

- වේද භේදයනට විරුද්ධව කිතුනු ධාර්මික ඉගැන්වීම් ඉදිරිපත් කිරීම
- ක්‍රිස්තියානි ධර්මයේ සත්‍යතාව පෙන්නුම් කිරීම
- සභාවේ විශ්වාසය ආරක්ෂා කිරීම
- සභා ඉගැන්වීම් පැහැදිලි කරමින් දේව ධර්මීය පොත් ලිවීම
- ශුද්ධ වූ ලියවිල්ල පහදා දීම
- ශුද්ධ වූ ලියවිල්ලේ ඉගැන්වීම් පිළිබඳ අටුවා පොත් ලිවීම
- තාපස ජීවිතය ආරම්භ කිරීම
- කිතුනු තාපස ක්‍රමය පිළිබඳ නීති රීති සම්පාදනය කිරීම

iv. තාපස ක්‍රමය ආරම්භක අවධියේ දී එහි දක්නට ලැබුණු ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

- දිළිඳුකම, යාච්ඤාව හා මර්ධන ක්‍රියාවලට මුල්තැන දීම
- ගැඹුරු නිෂ්ශබ්දතාවය
- තම නිවෙස්වලම වසමින් ලෞකික ජීවිතයෙන් ඉවත් වී අධ්‍යාත්මික ජීවිතයක් ගත කිරීම
- කාන්තාර හෝ වනාන්තර ස්ථානවලට වී තනිවම තපස් රැකීම
- තනි කුටිවලට යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම
- ව්‍රත ශුද්ධිය ආරක්ෂා කිරීම
- ශ්‍රමය යොදා වැඩ කිරීම

v. කාන්තාරයේ පියවරුන්ගේ ජීවිතයෙහි දක්නට තිබූ විශේෂ ලක්ෂණ හතරක් නම් කරන්න.

- ක්‍රි.ව. 03 වන ශත වර්ෂයේ සිට ඊජිප්තුවේ කාන්තාරවල විසූ කිතුනු තාපසවරු කාන්තාරයේ පියවරු ලෙස හැඳින්වූහ.
- කිස්තුන් වහන්සේව අනුගමනය කිරීම සඳහා යාච්ඤාවෙන් හා භාවනාවෙන් ජීවත් වීම පිණිස කාන්තාර තුළ දිවි ගෙවූහ.
- ස්නාවක ජුවාළුතුමාගේ වනගත ජීවිතය සහ කිස්තුන් වහන්සේගේ කාන්තාරයේ නිරාහාරශීලි ජීවිතය ආදර්ශ කොට ගත්හ.
- ශාරීරික සැපත හා මාංශික ජීවිතය පසෙකලා රළු ඇඳුම් ඇන්දෝය. කටුක ජීවිතයක් ගත කළහ.
- තම දේපළ ගේ දොර ආදිය අතහැර තපස් රැකිය
- ව්‍රත ශුද්ධිය ආරක්ෂා කළහ.
- දේව වචනය ගැන මෙනෙහි කළහ.
- කුඩා කුටි හෝ හුදකලා තැනකට වී යාච්ඤා කළහ.

02. i. **මධ්‍යතන යුගයේ සභාවේ තිබූ ලක්ෂණ පිළිබඳ පොදුවේ කරුණු හතරක් ලියන්න.**

- සභාවේ නායකයන් ආගමික කටයුතුවලට පමණක් සීමා නොවී පොදුවේ සමාජීය සහ පරිපාලනනමය කටයුතුවල නිරත වීම
- සභා නායකයන් බොහෝ දුරට ලෞකිකත්වයට නැඹුරුව ජීවත් වීම
- දේපළ අත්පත් කර ගැනීම
- ලෞකික සැපතට නැඹුරු වීම
- ගම්බද විසූ බොහෝ පූජකවරුනට ධර්මය පිළිබඳ මනා දැනුමක් නොමැති වීම
- ආගමික නායකයන්ගේ උපදෙස් නොලැබීම නිසා සාමාන්‍ය ජනතාව සභාවෙන් ඉවත් වීම
- සදාචාරයෙහි තොර ජීවිතයක් ගත කිරීමට පෙළඹීම
- විශාල දේවස්ථාන බැසිලිකා ආදිය ගොඩ නැඟීමට පෙළඹවීම
  ඒ වෙනුවෙන් ජනතාවගෙන් විශාල ලෙස බදු අය කර ගැනීම
- සභාවේ ලෞකිකත්වයට පිටු පා අධ්‍යාත්මික ව්‍යාපාර ඇති වීම
- කුරුස යුද්ධ නිසා ඉස්ලාම් භක්තිකයන් සමග සටන් වැදීම

ii. **මධ්‍යතන යුගයේ දී සභාවේ ප්‍රතිසංස්කරණයට හේතු වූ ආගමික පසුබිම පිළිබඳව කරුණු හතරක්**

- සභාව ඉතා තදින් ලෞකිකත්වය වැළඳ ගෙන සිටීම
- සභා නායකවරු රාජ්‍ය පරිපාලනයට හා දේපල පාලනයට සම්බන්ධ වී සිටීම
- පූජකවරුන් හා පැවිදි වරුන්ගේ සදාචාරයෙන් තොර පැවැත්ම
- ගිහි ජනතාව ධර්මය හරිහැටි නොදැන සිටීම
- පැවති තත්වයට විරුද්ධව අධ්‍යාත්මික ව්‍යාපෘති බිහි වීම
- තාපස නිකායන් මහත් ලෙස ධනය රැස්කර හා අධ්‍යාත්මික ජීවිත ක්‍රමයෙන් ඉවත් වීම
- නාගරීකරණය සහ පුනරුදය සභාවේ ජීවිතයට බෙහෙවින් බලපෑම
- මුදල් රැස් කිරීම් සඳහා අධ්‍යාත්මික දේ (පූර්ණ ඵල) විකිණීම
- ගිහි ජනතාව සභාව කෙරෙහි මහත් සේ කලකිරීම් සිටිම
- නව චින්තනයක් බිහි වීම සභාවේ විශ්වාසයට බලපෑම

iii. **ක්ලුනි තාපස ක්‍රමයේ දක්නට තිබූ අධ්‍යාත්මික ලක්ෂණ හතරක් නම් කරන්න.**

- ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කරමින් යාච්ඤාවේ ආශ්‍රමික ජීවිතයක් ගත කිරීම
- තපස් ක්‍රියාවන් හි නිරතවීම
- ව්‍රත ශුද්ධිය රකිමින් පාරිශුද්ධ ජීවිතයක් ගත කිරීම
- දේශනා පවත්වමින් තැනින් තැන සංචාරය කිරීම

- දිගු කාලයක් යාච්ඤා සඳහා ගත කිරීම
- සරල අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීම
- බෙනදිකානු නීති රීති නිසායාකාරව පිළිපැදීම
- සභාවේ පාලනයට තම අධ්‍යාත්මික සහය දීම
- අධ්‍යාත්මික සේවාව සඳහා මුදල් ගැනීම ප්‍රතික්ෂේප කිරීම

**iv. යාචක නිකා බිහි වීමට හේතු වූ කරුණු හතරක් ලියන්න.**

- ක්‍රිස්තුත් වහන්සේගේ ශුද්ධවත් දිළිඳු ජීවිතය, පවතින සමාජය තුළ ක්‍රියාත්මක කරවීමට දැරූ ප්‍රයත්නය.
- පූජකවරුන් සහ සභා නායකයන් ගැළුම් නිරාකරණය , කුරුස ශුද්ධ ආදියෙහි නිරත වෙමින් අධ්‍යාත්මික කටයුතු අතපසු කිරීම
- දේපළ හිමිකර ගත් සභා නායකයන් ඒවා නඩත්තු කිරීමට කාලය යෙදවීම
- සභාවේ පිරිහුන තත්වය හමුවේ සටනින් නොව යහපත් ක්‍රියා මගින් පමණක් සභාව රැකගත හැකි බව පිළිගත් පිරිසක් බිහි වීම
- ක්‍රිස්තුත් වහන්සේගේ දුගී බව ආදර්ශයට ගෙන ජීවත් වීම
- සියල්ල පොදුවේ තබා ගනිමින් ගිහි ජනතාවට ආදර්ශයක් ගෙන දීම
- තම දෛනික අවශ්‍යතාවයන් සිගමනේ යෙදමින් ලබා ගැනීම
- ලෞකික සැපතේ නොව අධ්‍යාත්මික සැපතේ වටිනාකම පෙන්වා දීම
- දේශනාවල යෙදමින් ශුවිශේෂක වටිනාකමේ පහදා දීම

**v. සභාවට හා සමාජයට ශිෂ්ටර්ශියන් තාපසවරුන්ගෙන් සිදු වූ සේවාව පිළිබඳ කරුණු හතරක් සඳහන් කරන්න.**

- බෙනඩිකානු සහ ක්ලුනි තාපස ක්‍රමයේ නීති නිවැරදිව ඉදිරියට ගෙන යාම
- තාපසාරාමවලට ලැබුණු ආදායම ප්‍රතික්ෂේප කර ආරාමයේ වැඩකටයුතු සඳහා ගිහි සහෝදර පිරිසකගේ ගිහි ස්වේච්ඡාදායකයන්ගේ සේවය ලබා ගැනීම
- හුදකලා තපස් බව සහ යාච්ඤාවේ ජීවිතය
- ගෙවතු වැඩවල නිරතවමින් ආදර්ශයක් දීම
- සාංඝික ජීවිතයක් ගත කිරීම
- ප්‍රංශයේ රජතුමාට අධ්‍යාත්මික වශයෙන් උපදෙස් වීම
- ජනතාව අතරට ගොස් ඔවුන්ගේ ප්‍රශ්න විසඳා ගැනීමට උදව් දීම
- යුරෝපයේ තාක්ෂණය පතුරුවාලීමට ක්‍රියා කිරීම

03. **i. මතෙයා රිච් පියතුමන්ගේ ධර්ම දූතික ක්‍රියාවලිය තිබූ විශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරන්න.**

- ස්වභාෂා හැදෑරීම (චීන භාෂාව) සහ (චීන) ජාතික වත් පිළිවෙත් ගරු කිරීම
- කලා හා විද්‍යාව අගයමින් ඒවා කෙරෙහි උනන්දුවක් දැක් වූ පියවරුන් ගෙන්වා ගනිමින් චීන උගත් පිරිසගේ (කොන්ෆියුසියස්) හිත දිනා ගැනීම
- චීන උගත් පන්තිය අනුව යමින් ඔවුන්ගේ ඇඳුම් පැළඳුම්වලින් සැරසී චීන සිරිත් විරිත් පිළිපැදීම
- ඉපැරණි චීන ශිෂ්ටාචාරය ගරු කරමින් එහි ඇතැම් වත් පිළිවෙත් කිතුනු ආගමික වන්දනා ක්‍රමවලට ඇතුළත් කිරීම
- චීන ශාස්තෘවරයකු වන කොන්ෆියුසියස් දෙවි කෙනෙකු නොව විශිෂ්ටතම උගතෙකු බව කිතුනු නායකයන්ට ඒත්තු ගන්වා එම සිරිත් අනුගමනය කිරීමේ නිර්වද්‍යතාවය පෙන්වා දීම
- චීන භාෂාවෙන් ධර්මෝපදේශ ග්‍රන්ථයක් සකස් කිරීම
- කිතුනු යාච්ඤා ස්ව භාෂාවෙන් (චීන) උච්චාරණය කිරීමට සැලසීම
- තාක්ෂණික උපකරණ හා තමා නිපද වූ ලෝක සිතියම් පෙන්වමින් උගතුන්ගේ සිත දිනා ගැනීම

**ii.** 18 වන සහ 19 වන **ශත වර්ෂවලදී චීනයේ සභාව මුහුණ දුන් අභියෝග හතරක් නම් කරන්න.**

- මතෙයා රිච් පියතුමන් ස්වදේශීකරණය XI වන ක්ලේමන්ට් ශුද්ධෝත්තම පියතුමන් විසින් තහනම් කිරීම නිසා චීනය කිතුනු ධර්ම දූත ව්‍යාපාරයට විරුද්ධ වීම
- 1715 දී චීන වත් පිළිවෙත් අනුගමනය කිරීම මුළුමණින්ම තහනම් කිරීම නිසා චීන අධිරාජයා විසින් ක්‍රිස්තියානි ධර්මය ප්‍රචලිත කිරීම තහනම් කිරීම
- 1724 දී ජේසු නිකායික පියවරු හැර අන් සියලු ධර්මදූතවරුන් චීනයේ පිටුවහල් කිරීම
- ස්වදේශීකරණය තහනම් කිරීම නිසා චීන උගතුන් ක්‍රිස්තියානි ධර්මය ප්‍රතික්ෂේප කිරීම
- කිතුනු ආගමික පීඩනයක් ආරම්භ කිරීම
- චීන කතෝලික සභාව ක්‍රමයෙන් පිරිහීමට ලක් වීම

**iii. ශාන්ත ප්‍රැන්සිස් ක්සාවියර්තුමන්ගේ කාලයේ සිට ජපානය තුළ කිතු දහම ප්‍රචලිත කිරීම සඳහා උපයෝගි කරගත් ක්‍රියා මාර්ග හතරක් ලියන්න.**

- ප්‍රැන්සිස් ක්සාවියර්තුමන් ජපානයට ගිය සමයේ සිට ක්‍රිස්තියානි ධර්මය ප්‍රචලිත කිරීමට වෙර දැරීම
- ක්‍රිස්තියානි ධර්මදූතවරු ජපානයට ගොස් සභා ස්ථාපිත කිරීම
- ජපානයේ ක්‍රිස්තු ද්වස්ථානය ඉදි කිරීම
- යුරෝපීය නූතන අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
- තාක්ෂණික අධ්‍යාපනය හඳුන්වාදීම
- පාසල් ආරම්භ කළ අතර පසු කාලීන ඒවා ප්‍රසිද්ධ විශ්ව විද්‍යාල බවට පත්වීම

**iv.** 16 වන සහ 17 වන ශත වර්ෂවල දී ශ්‍රී ලංකාව තුළ පෘතිගීසීන් මුහුණ දුන් ධර්ම දූතික අභියෝග හතරක් නම් කරන්න.

- ස්වදේශීය භාසාවන් නොදැනීම ධර්ම ප්‍රචාරයට බාධාවක් වීම
- මේ නිසා සිංහල සහ දෙමළ භාෂා ඉගැනීමට සිදු වීම
- සීතාවක සහ මහනුවර රාජ්‍යයකට කෙසේවත් යාමට නොහැකි වූ අතර කෝට්ටේ රාජ්‍යයේ රජවරුන්ගෙන් ධර්ම ප්‍රචාරයට සහය නොලැබීම
- පෘතුගීසින්ට එරෙහි වූ වීදිය බණ්ඩාර දකුණු පෙදෙසේ සේවස්ථාන විනාශ කර දැමීම
- යාපනයේ සංගිලි රජතුමා විසින් මන්නාරමේ කතෝලිකයන් 600 දෙනා මරා දැමීම
- 17 වන ශත වර්ෂයේ මැද භාගයේ දී බලය අල්ලාගත් ලන්දේසී හු පෘතුගීසීන් රටින් පළවා හැරීම

**v.** පෘතුගිසීන් පළමුවරට ශ්‍රී ලංකාව තුළ තිබූ රාජධානි 02 ක් හා ඒවායේ රජවර නම් කරන්න.

- කෝට්ටේ රාජධානිය - 09 වන පරාක්‍රමබාහු රජතුමා
- මහනුවර රාජධානිය - සේනා සම්මත වික්‍රමබාහු රජතුමා
- යාපනය රාජධානිය - පරරාජසේකරන් රජතුමා

## II කොටස

**04.** සෑම කිතුනුවෙකුගෙන්ම නිවැරදි ජීවිත මාර්ගයක් හා යාගික කැපවීමක් බලාපොරොත්තු වන නිසා කිතුනු ශ්‍රාවකත්වය අභියෝගාත්මක එකකි.

**i.** ශුද්ධ වූ මතෙව්තුමා විසින් ලියූ ශුද්ධ වූ සුවිශේෂයේ සඳහන් වන ආකාරයට භගය අට තුළ හමුවන අභියෝගාත්මක කරුණු මොනවාදැයි සඳහන් කරන්න.

- ජේසුස් ක්‍රිස්තුත් වහන්සේ මෙළොවට පැමිණියේ දේව රාජ්‍ය පතළ කිරීමටය. උන්වහන්සේ තම ග්‍රාමයට ගොස් කළ පළමු දේශනයෙන්ම ප්‍රකාශ කළේ දේව රාජ්‍ය ළගා වී ඇති බවයි. දේව රාජ්‍ය තුළ ඇත්තේ මෙළොව වටිනාකම් නොව මෙළොව වටිනාකම්වලට විරුද්ධ වටිනාකම් මාලාවකි. ක්‍රිස්තුත් වහන්සේ කන්ද උඩ දේශනය මගින් ප්‍රකාශ වන්නේ එම දේව රාජ්‍ය වටිනාකම්ය. එයිනිදු එම දේශනයේ සාරංශයක් බඳු දේව භාග්‍ය අටෙහි දේව රාජ්‍ය වටිනාකම් මොනවාදැයි මනාව පැහැදිලි කෙරේ. මෙලෝ වටිනාකම් මතම ජීවත්වන කෙනෙකුට එකී වටිනාකම් කොහෙත්ව පිළිගැනීමට නොහැකිය. එහෙත් ක්‍රිස්තුත් වහන්සේ පවසන්නේ සැබෑ සතුට ජීවිතයේ සැබෑ පරමාර්ථය සහ අරමුණු ගැබ්ව ඇත්තේ ඒකී වටිනාකම් තුළ පමණක් බවය.

දුගී බව කිසිවෙකු භාග්‍යක් ලෙස නොසලකයි. එහෙත් මෙළොව වස්තූන් ඇලී ගැලී සිටින මෙලොව වස්තුව සොයන කිසිවෙකු සැබෑ ප්‍රීතිය කිසිවිටෙකත් අත්කර නොගනී. ඒ වෙනුවට ක්‍රිස්තුත් වහන්සේ පවසන්නේ ස්වකීය කැමැත්තෙන්ම මෙලොව වස්තූන් අත්හරින දුගී බව වැළඳ ගන්නා පුද්ගලයා සැබෑ භාග්‍යවන්තයකු බවයි. සැබෑ ඇතුළාන්තර සාමය අත්පත් කර ගන්නා බවයි. එලෙසෙම සාමය ඇති කරවීමට වෙහෙසීම යුක්තිය උදෙසා ක්‍රියා කරවීම පිරිසිදු හදවතක් ඇතිව ජීවත් වීම මෙලොව වශයෙන් අපහසු කරුණුය. මෙලොව සිටින බොහෝ දෙනා ඒවට ප්‍රතිවරුද්ධ වනවා පමණක් නොව එසේ ජීවත් වීමට ප්‍රයන්ත දරන්නන්නට පීඩා ගෙන දේ. එහෙත් අභියෝග හා පීඩා මැද යුක්තිය ඉටු කරන්නා සාමය වෙනුවෙන් ක්‍රියා කරන්නා නිර්මල හදවතක් ඇතිව ජීවත් වන්නා සැබැවින්ම මෙලොවේ දී සැබෑ ප්‍රීතිය අත්විද අවසානයේ ස්වර්ගීය රාජ්‍යයේ විසීමේ භාග්‍ය ද ලබනු ඇත.

**ii. කිතුනු ජීවිතය ජීවත් වීමේ දී ක්‍රිස්තුන් වහන්සේගේ බැහැපත්කම අභියෝගාත්මක ආදර්ශයකි. සාකාච්ඡා කරන්න.**

මම හෘදයෙන් බැහැපත් වූව ද ශාන්ත දාන්ත වූ තැනැත්තා වෙමි. දෙවියන් වහන්සේ දුබල මිනිසත් බව ගැනීම තරම් මැවූම් කරුවාවන් මැවිල්ලේ තත්වයට පත් වීමක් තරම් තවත් බැහැපත් කමක් නැත. ක්‍රිස්තුන් වහන්සේ හුදු මිනිස් බව ගත්තා පමණක් නොව ශුද්ධ වූ පාවුළුතුමාන් පිලිප්පිවරුන්ට ලියන ලිපියේ සඳහන් කරන ආකාරයට වහලෙකුගේ තත්වය ගත් සේක.
වහලෙකු යනු කිසිඳු ආයිතිවාසිකමක් නැති තැනැත්තෙකි. ක්‍රිස්තුන් වහන්සේ අපට ගැලවීම දෙනු වස් තමන් වහන්සේවම මුළුමණින්ම හිස් කර ගත් සේක. එදා කුරුසියේ මරණයට පත් කළේ මහා අපරාධකරුවන් රාජද්‍රෝහීන් හා වහලුන් වැනි අයය. උන්වහන්සේ අප උදෙසා මරණයට පත් වන්නේ කුරුසියේ ඇණ ගැසූ පමණි. ඒ උන්වහන්සේගේ පූර්ණ හිස්වීමේ ක්‍රියාදාමයකි. එලෙස උන්වහන්සේ ජීවත් වූයේ තමන් වහන්සේ වෙනුවෙන් නොව අන්අය වෙනුවෙනි. "මම මෙලොවට පැමිණියේ මාගේ කැමැත්ත ඉටු කිරීමට නොව මාගේ ස්වර්ගික පියාණන් වහන්සේගේ කැමැත්ත ඉෂ්ඨ කරදීමටය." යැයි උන්වහන්සේ වදාළ සේක. තව දුරටත් උන්වහන්සේ මෙසේ වදාළ සේක. " මා පැමිණියේ සේවය කිරීමට මිස සේවය ලැබීමට නොවේ". මෙලෙස ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය ගත් කළ උන්වහන්සේගේ බැහැපත්කම පූර්ණ හිස්වීම හා අන්අය වෙනුවෙන් තමන් වහන්සේගේ ජීවිතය ජීවත් කරවීම දැකිය හැකිය.

**iii. නූතන කිතුනු සමූහයන්ට මුල් කිතුනුවන්ගේ සාංගික ජීවිතය අභියෝගාත්මක විය හැකි වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.**

මුල් කිතුනු සමූහය එක්සිත්ව එක්සත්ව විසූ බවත් තමා සතු දේ තමා සහෝදර ජනතාව සමග බෙදා ගනිමින් සාංගික ජීවිතයක් ගත කළ බවත් ක්‍රියාපොතේ 02 හා 04 පරිච්ඡේදවල සඳහන් වේ. ක්‍රිස්තියානි සමූහයේ මෙම ජීවිත කලාපය එදා සමාජයට අලුත් අත්දැකීමක් වූයේය. මන්ද යත් ජුදා ජනතාව අන්‍ය ජාතික සියළු දෙනා පහත් කොට සැලකූ අතර ඔවුන් සමග කිසිඳු සම්බන්ධතාවයක් නොපැවැත් වූ හෙයිනි. එලෙසම ස්වාමිවරුන් වහල් සේවයේ යෙදෙනනන් තමාට අයත් දේපළක් සේ සලකා ඔවුන්ට කෘර ලෙස සලකමින් වැඩ ගත්තා මිස කිසිඳු අයුරකින් ඔවුන් තමන් හා සමාන ලෙස නොසැලකූහ. එහෙත් ශුද්ධ වූ පාවුළු තුමන් පවසන්නේ ක්‍රිස්තුන් වහන්සේ තුළ අලුත්ම පිරිසක් බවට පත් වූ බවය. ක්‍රිස්තුන් වහන්සේව පිළිගත් අය අතර ජුදා හෝ රෝම කියමින් වහලුන් හා ස්වාමිවරු කියාවත් ස්ත්‍රී හා පුරුෂ කියාවත් කිසඳු භේදයක් නොවීමය. මෙලෙස ක්‍රිස්තුන් වහන්සේගේ දහම තුළ එදා සමාජයේ බිහි වූයේ මුළුමණින්ම අලුත් සමාජයකි.

එදා තිබූ එම කිතුනු සමූහය අද කිතුනු අපට අභියෝගයකි. අපේ මේ කුඩා රට ආගම් ජාතීන් වශයෙන් බෙද වී ඇත. අනෙක් ජාතීන් හා ආගම් අදහන්නෙකු පිළිගන්නට අදත් සමහරු සූදානම් නැත. එලෙසම අපේ රටතුළ දූගී හා ධනවතුන් අතර මහත් පරතරයක් ඇතිවෙමින් පවතී. ධනවත් අය මහත් සේ සැප සම්පත් භුක්ති විඳිද්දී දූගී අයට ජීවිතය බරක් වී ඇත. එලෙසම දිනපතා රටවල තුළ සිදුවන අපරාධ ද මිනිමැරුම් ආදිය ද වැඩිවෙමින් පවතී. අන්අය ගැන දක්වන සැලකිල්ල හීනවෙමින් පවතින අතර සියල්ල තමන්ට පමණක් අයිතිකර ගැනීමේ තරගයක් සමාජය තුළ දක්නට ලැබේ. වෙළඳ ලෝක ජනතාව ධෛර්යමත් කරන්නේ ද සියල්ල තමන්ට පමණක් ලබා ගැනීමේ ඇති විශිෂ්ඨත්වය ගැනයි. එලෙසම නායකයන් ද විවිධාකාර ලෙස බෙද වී ඇති අතර ජනතාව ගැන සැලකිල්ල දක්වනවා වෙනුවට තමාගේ බලය හා ධනය පමණක් රැකගැනීමේ උත්සහයක යෙදී සිටී. අපගේ සමාජය දෙස බලන විට අද අපට පෙනී යන්නේ එදා මුල් කිතුනුවන් තුළ වූ නව ජීවිතයට හාත්පසින්ම වෙනස් වූ තත්වයකි. එහෙයින් ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ සාක්ෂිකරුවන් වීමට නම් අපට මෙම සමාජ ක්‍රමය ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ. එහෙත් එලෙස කිරීම එදා මුල් කිතුනුවන්ට මෙන්ම අද අපට ද මහත් අභියෝගයකි.

**iv. "බෙනඩික්ටානු තාපස ජීවිතය කිතුනු ශ්‍රාවකත්වයේ අභියෝගාත්මක කරුණු සම්බන්ධයෙන් සාකාච්ඡා කරයි."**

ශාන්ත බෙනඩික් තුමා යුරෝපයේ පියා යැයි හැඳින්වීම නිවැරදිය. එදා වැඩ කිරීම පහත් කොට සැලකූ යුගයක වැඩ කිරීම පැවිදි දිවියේ එක් ප්‍රධාන අංගයක් ලෙස පෙන්වා දුන්නේ ශුද්ධ වූ බෙනඩික්තුමාය. බෙනඩික්ටානු නිකායේ ආදර්ශමත් පාඨය වන්නේ " යාච්ඤා කිරීම හා වැඩ කිරීමයි" වැඩ කිරීම පැවිදි දිවියේ අංගයක් කළ එතුමා සියළු වැඩ එක හා සමාන උසස් බව පෙන්නුම් කළේය. ශුද්ධ වූ බෙනඩික්තුමා ජීවත් වූ කාලයේ වැඩ කිරීම වහලුන් හා සාමාන්‍ය දුගී ජනතාවට පමණක් හිමි වූ කාර්යයක් ලෙස සැලකීය. එහෙත් බෙනඩික්ටානු නිකායක පැවිදිවරුන් විසින් විශාල සමූහ ගොවිපොළවල් ඇති කොට එකමුතුව වැඩ කරනු දැකීම අන් ජනතාවට මහත් ආදර්ශයක් ගෙන දුන්නේය. වැඩ කිරීම හා එමගින් ලෝකය පූර්ණත්වය කරා ගෙන ඒම කිතුනු අප සැමගේ වගකීමයි. මන්ද එය මැවීම කතාව තුළ දෙයවින් වහන්සේ විසින් මනුෂ්‍යයාට බාර දුන් කාර්යයක් ලෙස දැකිය හැකිය. එලෙසම යුරෝපීය අධ්‍යාපනයේ පූරෝගාමීන් වූයේ ද බෙනඩික්ටානු තාපසරුන්ය. සෑම බෙනඩික්ටානු ආරාමයක් ඉදිරිපිටම පාසලක් ආරම්භ වූ අතර පැවිදි අය ආරාම තුළ අධ්‍යාපනයේ යෙදීම ද පොතපත පිටපත් කිරීමේ ද යෙදුනහ. එලෙසෙ මුද්‍රණය සොයා ගෙන නොතිබූ එම සමයේ පොත් පිටපත් කිරීම පැවිදිවරුන්ට මෙන්ම අන්අයට ද මහත් සේ ප්‍රයෝජනවත් වූයේය.

බෙනඩිකාන දිවිය වැඩ කිරීම හා අධ්‍යාපනට සීමාවක් වූවක් නොවේ. එය යාච්ඤාව හා බැදි ජීවිතයකි. දවසේ කීපවතාවක් තාපසයින් එක්ව සාමුහිකව යාච්ඤා කිරීම බෙනඩිකානු තාපස ක්‍රමයේ ප්‍රධාන අංගයකි. මෙලෙස දිවා කාලයේ දී දේව රාජ්‍ය පතල කිරීමේ නියුතු වෙමින් උදේ හවස තම ස්වර්ගික පියාණන් හා එක්වෙමින් යාච්ඤාවේ නිමග්න වූ බෙනඩිකානු තාපස දිවිය එදා සමාජයට මෙන්ම අද ජීවත් වන අපටද ආදර්ශමත් අභියෝගයකි.

**05. යුරෝපීය ග්‍රෝත්‍රයන් ක්‍රමානුකූලව සිත් හැරීම සභාවේ වර්ධනය සඳහා විවිධාකාර ලෙස උපකාරී වී ඇත.**

***i. යුරෝපීය ග්‍රෝත්‍රයන් ක්‍රමානුකූල ලෙස කිතු දහම වැළඳ ගැනීමට හේතු මොනවාදැයි පැහැදිලි කරන්න.***

යුරෝපයේ විවිධ රටවල විසූ රජවරු ක්‍රමයෙන් කිතුනු දහම වැළඳ ගැනීමට පෙළඹුනහ. එහෙයින් ජනතාව කිතු දහම වැළඳ ගැනීමට ප්‍රධාන හේතුවක් විය. නිදසුනක් ලෙස බලාපොරොත්තු නොවූ ආකාරයෙන් යුද්ධයෙන් ජයගත් ප්‍රංශයේ කොලොවියස් රජතුමා කිතු දහම වැළඳ ගැනීම නිසා ඔහු සමග සිටි සෙබලුන් 3000 ක් දෙනාද කිතු දහම වැළඳ ගත්තේය. ඩෙන්මාකයේ ජ්ලේඩ් රජතුමා කිතු දහම වැළඳ ගැනීම එම රටෙහි ජනතාව කිතු දහම වැළඳ ගැනීමට හේතු විය. ධර්ම දූතවරුන්ගේ ක්‍රියා කලාපය ද ග්‍රෝත්‍රිකයන් කිතු දහම වැළඳ ගැනීමට හේතුවක් විය. තම රටේ රජවරුන් ග්‍රෝත්‍රිකයන් සටනින් පරාජය කළ විට ධර්ම දූත වරුන් එම පෙදෙස්වලට ගොස් ධර්ම ප්‍රචාරයෙහි යෙදුනාහ. විශේෂයෙන් ශාන්ත පැට්‍රික්තුමන් ධර්ම දූත සේවය සඳහාම බොහෝ ධර්ම දූතවරුන් පුරුදු කළේය. ඉහත සඳහන් කාරණා ග්‍රෝත්‍රිකයන්ගේ හිත් හැරීමට හේතු විය.

***ii. අයර්ලන්තය කිතු දහම වැළඳ ගැනීමේ දී ශුද්ධ වූ පැට්‍රික්තුමන්ගේ දායකත්වය කුමක්දැයි දක්වන්න.***

අයර්ලන්තයේ ශාන්තුවරයා වශයෙන් සලකන්නේ ශුද්ධ වූ පැට්‍රික් තුමන්ය. වහලෙකු වශයෙන් අයර්ලන්තයට ගිය ශුද්ධ වූ පැට්‍රික් තුමන් නිදහස ලැබුවයින් පසුව කිතු දහම වැළඳ ගෙන අයර්ලන්තයේ ධර්ම ප්‍රචාරයේ යෙදුනේය. එතුමාගේ අදහස වූයේ අයර්ලන්තය තුළ කිතු දහම ඉක්මණින්ම ව්‍යාප්ත වීමට නම් අයර්ලන්ත ජාතිකයන් පැවිදිවරුන් වී ධර්ම ප්‍රචාරය යෙදී යුතු බවයි. එතුමන් මෙලෙස ස්වදේශිය පූජකවරුන් බිහිවීම සඳහාම නිකායක් පිහිටුවා සුදුසුකම් ඇති අය තුළින් තෝරාගත් අයට පූජකවරය ලැබීමට සැලැස් වීය. තාපසවරුන් ද බිහි කළහ. එතුමන්ගේ මෙම ප්‍රයත්නනය නිසා අයර්ලන්තය කතෝලික රටක් බවට පත් වූවා පමණක් නොව අනෙක් රටවලට ධර්ම ප්‍රචාරය සඳහා ද ධර්ම දූතවරුන් යැවීමට අයර්ලන්තයට හැකි විය.

*iii.* ***09 වන ශතවර්ෂය වන විට සියලු ග්‍රෝත්‍රිකයන් කිතු දහම වැළඳ ගැනීම යුරෝපයේ සමාජයේ සංවර්ධනයට බලපෑ ආකාරය පැහැදිලි කරන්න.***

අතීතයේත් වත්මන් සමයෙත් එකලෙස සමාජය තුළ යුද්ධ කොළාහල ආරවුල් පැවතීම සංවර්ධනයට බාධාවකි. එවැනි සමාජයකට ඉදිරියට යෑම ඉතා අපහසුය. ක්‍රිස්තු වර්ෂ පළමු ශත වර්ෂ 03 තුළ සභාවට පීඩාවන්ට මුහුණ දීමට සිදු වූ අතර අනතුරුව සභාවට මුහුණ පෑමට සිදු වූයේ ග්‍රෝත්‍රික ආක්‍රමණය. ක්‍රිස්තු වර්ෂ 05 වන ශතවර්ෂයේ ආරම්භයේ ම විසිගොත් නම් ග්‍රෝත්‍රය රෝමය ආක්‍රමණය කරන ලදී. මෙලෙස යුරෝපයේ සියළුම රටවල් පාහේ ග්‍රොතික බලයට යටවීමක් හෝ ග්‍රෝත්‍රියන් අන් රටවල් ආක්‍රමණය කිරීමේ යෙදුනාහ. මෙහි ප්‍රතිඵලය වූයේ රජවරුන් නිතරම ග්‍රෝත්‍රිතයන් සමග සටන් කිරීම පමණක් නොව ශුද්ධෝත්තම පියාණන්ට පවා හමුදා තබා ගැනීමට යුධ වැදීමටත් සිදු වීමය. එහෙත් එක එක ග්‍රෝත්‍රය හා ග්‍රොත්‍රික රටවල් පරාජය කිරීමත් සමග ධර්මදූත වරුන් විසින් එම ග්‍රෝත්‍රිකයන් කිතු දහමට හරවා ගනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 09 වන ශත වර්ෂය පමණ වන විට ග්‍රොත්‍රිකයන් සියල්ලෝම පාහේ කිතු දහම වැළඳ ගෙන සිටියහ. මේ නිසා යුරෝපය එක්සේසත් කිරීමට හැකි වූ අතර සියල්ලන් කිතුනුවන් නිසා යුරෝපය පුරා සාමය සහ එක්සත්කම ද දක්නට හැකිවිය. මේ යුරෝපීය රටවලට තම අවධානය රටේ සංවර්ධනය වෙත හැරවීමට හැකි වූ අතර අධ්‍යාපනයේ හා විද්‍යා තාක්ෂණයේ දියුණුව ආරම්භ වූයේ ද ඒ සමයෙහිය.

*iv.* ***සභාවේ වර්ධනය සඳහා මහා චාල්ස් අධිරාජයාගෙන් සිදු වූ සේවාව පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.***

චාල්මේන් හෙවත් මහා චාල්ස් අධිරාජයාගේ සභාවේ වර්ධනය සඳහා සිදු වූ සේවාව විවිධ අංශ ඔස්සේ සාකාච්ඡා කළ හැකිය. ශුද්ධෝත්ම පියාණන් විසින් රෝම ශුද්ධ වූ අධිරාජ්‍යාගේ අධිරාජ්‍යයා වශයෙන් අභිෂේක කළේ ප්‍රංශයේ පෙපින් රජතුමාය. ඔහු මහා චාල්ස් රජතුමාගේ පියාය. සැබැවින්ම ශුද්ධ වූ රෝම අධිරාජ්‍යයේ අධිරාජ්‍යා වශයෙන් ගිණිය හැක්කේ මහා චාල්ස් රජතුමාය. එතුමන් පාලනය කළ සමයේ ග්‍රෝත්‍රික ආක්‍රමණ මහත් සේ පැවතුණි. දිගින් දිගටම කෙරෙන ආක්‍රමණ අධිරාජ්‍යයේ පාලනයට මහත් සේ බාධාවක් විය. එහෙයින් එතුමන් කළේ එක් පෙදෙසක ග්‍රෝත්‍රිකයන් පරාජය කොට ඔවුන් ධර්ම දූතවරුන් මගින් හෝ බලහත්කාරයෙන් කිතු දහමට හැරවීමය. කිතු දහමට හැරවීමනේ පසු ඔවුන්ගේ සහය රජතුමාට හිමි විය. එවිට ඔවුන්ගේද සහය ඇතිව තවත් ග්‍රෝත්‍ර පරාජය කොට ඔවුන්වද කිතු දහමට හැරවීමෙන් ක්‍රමයෙන් යුරෝපය එක්සත් කිරීමේ හැකියාව ලැබිණ.

මහා චාල්ස් රජතුමාගේ විශිෂ්ඨම සේවාවන් සිදු වූයේ අධ්‍යාපනය සම්බන්ධයෙනි. ඔහු සෑම ආසන දෙව් මැදුරක්ම ආශ්‍රිතව අධ්‍යාපන ආයතනයක් ඇති කිරීමට රදගුරුවරුන්ට බල කළේය. පැවිදි ආරාම තුළ සිදු කළ අධ්‍යාපය ක්‍රමයෙන් පිටතට ව්‍යාප්ත වූයේ මෙම අධ්‍යාපන ආයතන තුළය. නිදහස් චින්තනයට මෙන්ම විශ්ව විද්‍යාල බිහි වීමට ද එම ආයතනය බලපෑවේය. සියලු පැවිදිවරුන් උගතුන් විය යුතු බව විශ්වාස කළ මහා චාල්ස් රජතුමා අල්කුයින් නැමැති බෙනදිකානු තාපසතුමන්ව මාළිගයේ අධ්‍යාපනඥයා වශයෙන් කටයුතු කිරීමට සැලසීය. නිරතුරුවම උගතුන් මාළියට ගෙන්වා ගෙන විවිධ සාචාච්ඡා කිරීමට ද මහත් චාල්ස් පුරුදුව සිටියේය.

*06. ක්‍රිස්තියානි ඉගැන්වීම් හා වටිනාකම් ප්‍රකාශ කිරීමේදී ක්‍රිස්තියානි කලා මාධ්‍යයන් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කොට ඇත.*

*i. කිතුනු ආගමික චිත්‍ර කිතුනු ඇදහිල්ලට හා සම්බන්ධ සන්නිවේදනයට දායක වී ඇති ආකාරය විස්තර කරන්න.*

චිත්‍රයක් ඉතා ඉක්මණින් හා පහසුවෙන් යම් පණිවිඩයක් දීමට හැකි මාධ්‍යකි. එපමණක් නොව එය කියවීමට හා ලිවීමට නොදත් අයෙකු හා යම් පණිවිඩයක් දීමට සමත් වූවකි. මධ්‍යතන යුගයේ බොහෝ චිත්‍ර ශිල්පියේ වූහ. ඒ සියල්ලෝම ඇඳ ඇති සියලුම චිත්‍ර ආගමික තේමාවත් මූල්කර ගෙන කළ ඒවා පමණක් නොව ඒවා ඇඳ ඇත්තේ ද දේවස්ථානයක තුළ හෝ වෙනත් ආගමික ස්ථානයකය. නිදසුනක් ලෙස මිලාන් නගරයේ පැවති ආරාමයක ලියනාඩෝ ඩාවින්චි විසින් ඇද ඇති අන්තිම රාත්‍රී භෝජනය චිත්‍රය ගත හැකිය. මෙම චිත්‍රය අපට ශුද්ධ වූ සුවිශේෂයන් හි අඩංගු ක්‍රිස්තුන් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය පිළිබඳ සිද්ධිය එක් විටම සිහියට නංවයි. එය එම උතුම් සිද්ධිය සිහියට නංවනවා පමණක් නොව ඒ ගැන අන්අයට පහදා දීමටද අවස්ථාව සලසයි. මෙම චිත්‍රය අද ලොව පුරා ප්‍රසිද්ධ වූවකි.

මයිකල් ඇන්ජලෝ සිත්තරාගේ සිතුවම් ගැනද ඒසේ කිව හැකිය. ඔහු චිත්‍ර ඇද ඇති එක් ස්ථානයක් වන්නේ රෝමයේ ශිෂ්ටයින් දෙව් මැදුරයි. එහි වහලයේ ඇති මැවීම පිළිබඳ සිද්ධිය ලෝකාන්තය වැනි චිත්‍ර ශුද්ධ වූ ලියවිල්ලෙහි එන සිද්ධීන් සිහියට නංවනවා පමණක් නොව ඒ පිළිබඳ පණිවිඩය ද සන්නිවේදනය කරයි. අනෙක් සිත්තරුන් ඇද ඇති අනෙකුත් ආගමික චිත්‍ර ගැන කිව හැක්කේ එයමය.

කැටකුම්බිහි ඇද ඇති චිත්‍ර ගත් කළ ඒවා රහස් පණිවිඩයක් දීමට භාවිතා කර ඇත. ඒවායේ ඇදි මාලුවා, බැටළු එඩේරා, පූප ආදිය තුළින් දෙන පණිවුඩය තේරුම් ගත හැකි වූයේ ක්‍රිස්තියානිත්ට පමණකි.

*ii. රෝම ශෛලියේ කලා නිර්මාණ තුළ දක්නට ඇති විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.*

රෝම ශෛලීය කලා නිර්මාණ තුළින් ගුරු කොට ඇත්තේ රෝමයේ පැවති ඉපැරණි බැසිලිකාය. එදා බැසිලිකා යනු රෝමවරුන්ගේ ජන රැස්වීම් ශාලාය. රෝම ශෛලියට අනුව ගොඩ නැගුණු දේවස්ථානවල දක්නට ඇත්තේ මේවාය.

- පළලට වඩා දිගින් වැඩි ඍජු කෝණාස්‍ර වීම
- ශාලාවේ අග අර්ධ කවාකාර ගුහාවක පූජාසන පිහිටා තිබීම
- වහලයේ රඳවන කුළුණු පේළි 02 ක් තිබීම
- ශාලාව ප්‍රධාන මැදි ශාලාවකින් හා කුළුණු දෙපස පටු තීරු 02 කින් යුක්ත වීම
- මැදි කොටසේ වහළය දෙපස තීරුවලට වඩා උස් වූ හෙයින් තට්ටු 02 ක ගොඩනැගිල්ලක් සේ දිස්වීම
- රෝම ශෛලියේ දේවස්ථාන රෝමයේ බටහිර කොටසේ තනා තිබුනේ හරිහතරැස් ගොඩනැගිල්ලක් ලෙසය. එලෙසෙම රවුම් හැඩයට තැනූ දේවස්ථාන මෙන්ම කුරුසයක හැඩයට තැනූ දේවස්ථාන ද රෝම ශෛලයේ දේවස්ථාන වේ.
- 04 වන ශත වර්ෂයේ නිර්මාණය කර ඇති ශාන්ත පේදුරු හා ශාන්ත පාවුළු, ශාන්ත ජෝන් ලැටරන්ස්, මේරි මේජ යන දේවස්ථාන රෝම ශෛලයෙන් නිර්මාණය කර ඇති දේවස්ථානය

*iii. ෆ්‍රෙස්කෝ චිත්‍රයන් හි දක්නට ඇති විශේෂ ලක්ෂණ මොනවාදැයි දක්වන්න.*

ෆ්‍රෙස්කෝ චිත්‍ර යනු අලුත් බිත්තිවල බදාම වියළීමට පෙර ඒවා මත අඳින චිත්‍ර වර්ගයකි. මෙහි නිර්මාතෘවරයා වශයෙන් සලකන්නේ ගියොට්ටෝ ඩී බෝර්ඩෝනේ ය. මධ්‍ය කාලීන යුගයේ රෝම ශෛලියට අනුව තැනූ දේවස්ථානවල ඝන බිත්ති මත චිත්‍ර ඇඳීම ඔහු ආරම්භ කළේය.

බෝර්ඩෝන් ගේ චිත්‍ර අතර ප්‍රසිද්ධම චිත්‍රය වශයෙන් සලකන්නේ ෆ්ලොරන්ස් නගරයේ අසීසියේ ෆැන්සිස් තුමන්ගේ දේවස්ථානයේ බිත්ති මත ඇඳ ඇති චිත්‍රය. එම චිත්‍රවල දක්නට ඇති විශේෂ ලක්ෂණය නම් චිත්‍රවල එන පුද්ගලයා තාත්විකය. පසුබිම ගස් කොළන් කඳු වැටි ආදියෙන් අලංකාර වී ඇත. කුරුල්ලන් වැනි සතුන් ඇඳ වෛවරණ පාට යොදා සිතුවම් කොට ස්භාව ධර්මයේ අංලකාරය විහිදා දක්වා ඇත.

*iv. සාධනීය කිතුනු ධර්මෝපදේශයක් බිහි කිරීම සම්බන්ධයෙන් කිතුනු කලාවේ විශේෂිත දායකත්වය කුමක් දැයි පැහැදිලි කරන්න.*

ධර්මෝපදේශය යනුවෙනු අදහස් කරන්නේ කෙනෙකු පිළිගත් ධර්මය ජීවත් වීම පිණිස එම ධර්මයෙන් දැනගත යුතු කරුණු කියාදීමයි. එනම් ධර්මය පිළිබඳ උපදෙස් දීමයි. මෙය විවිධ අංශවලින් කළ හැක්කකි. ධර්ම දේශනා, පොතපත සංගීතය චිත්‍ර හා චිත්‍රපට නාට්‍ය හා නෘත්‍ය නාඩගම් නූතන ජන සන්නිවේදනය මාධ්‍ය ආදි වශයෙනි. මෙම අංශ ජන වන්දනාව හා ධර්මෝපදේශය වෙනුවෙන් යොදා ගැනීමේ ඇති යෝග්‍යතාවය පමණක් නොව අවශ්‍යතාවය දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් ද අවධාරණය කරයි. චිත්‍රපට විඩියෝ, රූපවාහිනි ආදිය අද ප්‍රබල මාධ්‍යයෝ වෙති. මේවා මගින් ඉතා ඉක්මණින් ජනතාව වෙත පණිවුඩයක් දීම කළ හැක. පෘතුගීසි සමයෙහි සිට මෙවන් මාධ්‍යන් ධර්මෝපදේශය දීමේ මාර්ග ලෙස යොදා ගෙන ඇති බව පෙනේ. පෘතිගිසි ධර්ම දූතයන් විසින් දේවස්ථාන අසල ස්ථිර වේදිකා තනා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය හා ශාන්තුවර චරිත පිළිබඳව නාට්‍ය පෙන්වූ බව ශ්‍රී ලංකා සභා ඉතිහාසයේ පෙන්වා දෙයි. එලෙසෙම ගීතිකා හා පතපොත ද මේ සඳහා උපයෝගි කරගෙන ඇත. මිනිස් වටිනාකම් හා ආගමික වටිනාකම් ඉස්මතු කිරීම සඳහා චිත්‍රපට යොදා ගැනීම ද සභාව විසින් සිදු කොට ඇත. බෞද්ධ සිද්ධස්ථාන මෙන් කතෝලික දේවස්ථාන රැසක ද ආගමික තේමාවන් මුල් කොටගෙන චිත්‍ර ඇඳ ඇති සැටි දැකිය හැක.

*07. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී කිතු දහම මගින් ශ්‍රී ලංකා සමාජයේ යහපත සඳහා සැලකිය යුතු සේවාවක් සිදු කොට ඇත.*

*ශ්‍රී ලංකාවේ අධ්‍යාපන නංවාලීම සඳහා ප්‍රොතෙස්තන්ත්‍ර ධර්ම දූතවරුන්ගේ දායකත්වය කුමක්දැයි පැහැදිලි කරන්න.*

මෙය ඕලන්ද (ලන්දේසි) හා බ්‍රිතාන්‍ය (ඉංග්‍රීසි) පාලන සමය වශයෙන් කොටස් 02 න් සමන්විත වේ. ලන්දේසීන් විසින් කතෝලිකයන්ගේ අධ්‍යාපනය විනාශ කොට තහනම් කළද අධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට මහගු සේවාවක් කර ඇත. එම සමයේ දී ගැහැණු පිරිමි යන ළමුන් දෙපිරිසටම අධ්‍යාපනය අනිවාර්ය කරන ලදී. එලෙසෙම අධ්‍යාපන මණ්ඩලයක් ඇති කළේ ද පරීක්ෂකවරු පාසල් වෙත යාම ආරම්භ කළේ ද ලන්දේසි විසිනි. ඉංග්‍රීසි පාලන සමයේ දී ධර්ම දූතික කටයුතු මෙන්ම අධ්‍යාපන කටයුතු සඳහා ද බොහෝ ධර්ම දූතවරු ලංකාවට පැමිණියහ. ඒ අතරට ඇන්ගිලිකන් (ලංකා සභාව) බැප්ටිස් සභාව, මෙතොදිස්ත සභාව, ඇමරිකන් මිෂනාරි සභාවල ධර්ම දූතවරු අයත් වූහ. මුල් කාලයේ දි පාසැල් පරිපාලනයේ නිරත වූයේ රෙපරමාදු සභා පූජකවරුන්ය. රජයේ ආරම්භ කළ පාසල් පරිපාලනය ක්‍රමය මගින් ඉංග්‍රීසි භාෂාවෙන් උගන්වන පාසැල් කිහිපයක් ආරම්භ කරන ලදී. මෙයින් එම යුගයේ මුල සිටම ශ්‍රී ලංකාවේ ජනතාවට ඉංග්‍රීසි ඉගැනුමේ අවස්ථාව හිමි විය. කොළඹ රාජකීය විද්‍යාලය ඉන් එකකි. 1841 දී ආගමික පූජකවරුන්ට සාමාජිකත්වය දැරිය හැකි අධ්‍යාපන පාරිපාලන ක්‍රමයක් බිහි කළ අතර 1869 සිට සියලු ආගම්වලටට තම දරුවන් වෙනුවෙන් සභ පාසල් ආරම්භ කිරීමේ අවස්ථාව හිමිකරදීම. ඒවා සඳහා ආධාර දීමද සිදු විය. එවකට ප්‍රොතෙස්තන්ත්‍ර ධර්ම දූතවරුන් ආරම්භ කළ පාසල් අතරට මේවා අයත්ය.

ඇන්ග්ලිකන් : ශාන්ත තෝමස් විද්‍යාලය, ගල්කිස්ස

බිෂෝප් විද්‍යාලය, කොළඹ 07.

ට්‍රිනිටි විද්‍යාලය - මහනුවර

ශාන්ත ජෝන් විද්‍යාලය - යාපනය

මෙතෝදිස්ත : වෙස්ලි විද්‍යාලය - කොළඹ 14

කිංස්වුඩ් විද්‍යාලය - මහනුවර

රිච්මන්ඩ්ස් විද්‍යාලය - ගාල්ල

බැප්ටිස්ට් : කේරි විද්‍යාලය - කොළඹ 08

මීට අමතරව මෙවැනි සභා මගින් විද්‍යාල සහ සමාන්‍ය පාසැල් ආරම්භ කරමින් රටේ අධ්‍යාපනය නංවා ලීමට ක්‍රියා කළහ.

***ii. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී පොතෙස්තන්ත්‍ර ධර්ම දූතවරුන් විසින් සිදු කරන ලද දයාවේ සේවාවන් පිළිබඳ විස්තර කරන්න.***

1819 වසරේ දී ඇමරිකානු මිෂන් සේවය විසින් ආරෝග්‍ය ශාලා ආරම්භ කරන ලදී. ඇමරිකාවේ සිට පැමිණි ග්‍රීන් වෛද්‍යතුමා රෝගීන් වෙනුවෙන් සේවය කළේ කිසිදු ආගමික භේදයකින් තොරවය. 1898 දී වෛද්‍ය මැක්ලොයිඩ් දේව ගැතිතුමා සහ ඔහුගේ බිරිඳ විසින් ඉන්විල් හි තවත් ආරෝග්‍ය ශාලාවක් ආරම්භ කර එය මැක්ලොයිඩ් රෝහල නමින් නම් කරන ලදී. ඇමරිකානු මිෂනාරි සේවය මගින් උතුරු ප්‍රදේශයේ කාන්තාවගේ අයිතීන් වෙනුවෙන් කැපවී වැඩ කළහ. 1869 දී ලංකාවට පැමිණි ඉව්ලින් කානි මැතිනිය රජරට ප්‍රදේශයේ විශේෂයෙන් තලාව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල සේවාවක් කළාය. පාසලක්, ආරෝග්‍ය ශාලාවක් සහ අනාථ නිවාසයක් ඒ අතර වේ.

***iii. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී කතෝලිකයන් විසින් අත්දුටු වාසි හා අවාසි මොනවාදැයි පැහැදිලි කරන්න.***

බ්‍රිතාන්‍ය පාලන සමයේ දී කතෝලික සභාව අද්දුටු ප්‍රධානම වරප්‍රසාදය වූයේ ආගමික නිදහස ලැබීමය. වසර 150 ක් පුරා ලන්දේසී පාලන සමයේ දී තහනම් කර තිබූ කතෝලික දහම මෙලෙස නිදහසේ ව්‍යාප්ත වීමට අවස්ථාව උදාවිය. මේ හේතු කොට ගෙන 1830 සිට විදේශීය ධර්ම දූතවරුන් ලංකාවට පැමිණීම ආරම්භ කළේය.

අධ්‍යාපනය සම්බන්ධයෙන් ද කතෝලික සභාව බ්‍රිතාන්‍ය පාලන සමයේ දී විශාල වාසි රාශියක් අත්කර ගත්තේය. අධ්‍යාපනය සඳහාම ඩිලාසාල් හා මාරිස්ට් සොහොයුරන් ද ශුද්ධ වූ පවුලේ, යහපත් එඬේරා සහ ෆ්‍රැන්සිස්කාන ධර්ම දූත නිකායේ පැවිදි සොහොයුරියන් ද ශ්‍රී ලංකාවට පැමිණ රටේ විවිධ පළාත්වල විදුහල් ආරම්භ කළහ. අධ්‍යාපනය සඳහා යාපනය ශාන්ත ජෝශප් සොහොයුරන්ගේ සහ දකුණේ ෆ්‍රැන්සිස්කාන සොහොයුරන්ගේ පැවිදි නිකායන් බිහිවිය. බොන්ජීන් පියතුමන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ බලපෑම් නිසා 1869 දී සියලු ආගම්වලට තමන්ගේ දූ දරුවන් උදෙසා පාසල් ආරම්භ කිරීමට හැකිවිය. මෙහි ප්‍රතිපලයක් ලෙස කතෝලික සභාවට ප්‍රධාන පෙළේ විදුහල් රාශියක්ද සාමාන්‍ය පාසැල් 750 කට අධික පාසැල් සංඛ්‍යාවක් ද ආරම්භ කර සිසුන්ට අධ්‍යාපනය දීම අවස්ථාව හිමිවිය. අධ්‍යාපන අංශයෙන් රටට විශාල සේවාක කිරීමේ අවස්ථාව මෙලෙස කතෝලිකයන් ට හිමි විය.

දයාවේ ආයතන රැසක් ආරම්භ කිරීමටද බ්‍රිතාන්‍ය පාලන සමයේ දී කතෝලිකයන්ට හැකි විය. එනම් අඳ ගොළු බිහිරි හා අනාථ මඩම් මෙන්ම වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු මධ්‍යස්ථාන ඇතිකිරීමට හැකි විය.

බ්‍රිතාන්‍ය සමයේ දී කතෝලික සභාව අත්දුටු අවාසි කිහිපයක් නම්

බ්‍රිතාන්‍යයන් උසස් අධ්‍යාපන ආයතනවල ඉගැන්වීම කළේ ඉංග්‍රීසි බසිනි. රජයේ පරිපාලන භාෂාව වූයේ ද ඉංග්‍රීසි භාෂාවය. මේ සඳහා එංගලන්තය, ස්කොට්ලන්තය හා ඇමරිකාව යන රටවලින් ප්‍රොතෙස්තන්ත්‍ර ධර්ම දූතවරු පැමිණියහ. එහෙත් ශ්‍රී ලංකාවේ එවකට සේවය කරමින් සිටි ඔරතෝරියානු පූජකවරු ඉංග්‍රීසි බස නොදත්හ. මේ නිසා උසස් අධ්‍යාපන ආයතන ඇති කිරීම හෝ කතෝලික දරුදැරියන්ට ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය දීමේ හැකියාවක් නොවීය.

ඉන් අනතුරුව ශ්‍රී ලංකාවට පැමිණියේ ද ඉතාලි, ප්‍රංශ සහ බෙල්ජියම් ජාතික, ඉංග්‍රීසි භාෂාව නොදත් ධර්ම දූතවරුන්ය. කතෝලික සභාවට උසස් අධ්‍යාපනයට පිවිසීමට හැකියාව ලැබුණේ 1850 න් පසුවය. විශේෂයෙන් බොන්ජීන් පියතුමන්ගේ පැමිණීමත් සමගමය.

බ්‍රිතාන්‍ය පාලකයන් විසින් මුල් යුගයේ දී අධාර දුන්නේ ද ප්‍රෙතෙස්තන්ත්‍ර සභා ධර්ම දූතවරුන් විසින් පාලනය කළ පාසල්වලටට පමණි.1829 - 1832 කාලයේ කෝල්බෲක් දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාරවරයාව සිටි සමයේ ආරම්භ කළ අධ්‍යාපන කොමිසන් සභාවට පත්කළේ ද ප්‍රොතෙස්තන්ත්‍ර ධර්ම දූතවරුන් පමණක් නිසා කතෝලික සභාවට තමන්ගේ අවශ්‍යතා සඳහා හඬ නැංවීමට අවස්ථාවක් නොවීය.

**iv. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ශ්‍රී ලාංකික සමාජය වෙත බල පෑ කිතුනු වටිනාකම් පිළිබඳ විස්තරයක් කරන්න.**

දයාවේ සේවාවන් කිතුනුවන්ට අලුත් හෝ වැඩිපුර දෙයක් නොවේ. එය කිතු දහම හා බද්ධ වූවකි. මේ නිසා පෘතුගීසි සමයේ දී සිටම ධර්ම දූතවරු දයාවේ සේවාවන්හි නියලුනහ. විශේෂයෙන් බ්‍රිතාන්‍ය සමයේ දී ලැබූ ආගමික නිදහස නිසා අන්ධ ගොළු බිහිරි මඩම් හා අනාථ නිවාස බිහි විය. එවන් අයට සැලකීම අප සමාජය තුළ තිබුනත් සංවිධානාත්මකව එවැනි දේ ඇති වූයේ කිතුනුවන් මගිනි. මෙ අලුත් සංකල්පයක් නිසා බොහෝ දෙනෙකු කිතුනු සභාවන්ගේ දයාවේ ක්‍රියාව අගය කළහ.

එලෙසෙම ශ්‍රී ලංකාව තුළ පැවිදි පිරිස සමාජයට බැස ගිහි පිරිසට සේවය කිරීමේ සංකල්පයක් නොවීය. ආගමික නායකයන්, පැවිදි පිරිස් ජනතාවට සේවය කිරීමට කැපවීම ද අප සමාජයට එක් වූ කිතුනු වටිනාකමකි. අනාථ ළමුන් හිංසාවට ගොදුරු වූවන් අවිවාහක මව්වරුන් ආදි පිරිස් රැක බලා ගැනීමට මුල් වූයේ ද කිතුනු පිරිස්ය.

1819 දී ඇමරිකානු මිෂන් සේවය මගින් රෝගීන් රැක බලා ගැනීම සඳහා ආරෝග්‍ය ශාලාවක් ඇරඹීය. 1860 න් පසු ආරෝග්‍ය ශාලාවල සේවය කිරීමේ හා මහළු අය රැකබලා ගැනීම පිණිස කන්‍යා සොහොයුරියෝ පැමිණියහ.

බ්‍රිතාන්‍ය සමයේ දී ආගමික නිදහස ලැබුණු. මේ ලැබූ ආගමික නිදහස නිසා කිතුනු වටිනාම් සමාජයට පහසුවෙන් දයාද කිරීමට අවස්ථාව එළඹුණි. නිදසුනක් ලෙස අධ්‍යාපන ආයතනය, පුණ්‍ය ආයතන බිහි කිරීමේ වහල් සේවය තහනම් කිරීම, කාන්තාවන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම, විවාහයේ ශුද්ධ වන්ත භාවය ඇති කිරීම තවත් එම සමයේ සමාජයට එක් කළ පොදු දයාදයකි.

*08. සභාවේ ඉගැන්වීම මගින් සමාජය තුළ සාමය හා සංහිඳියාව නංවාලීමට හැකිවිය.*

***i. ආසියානු රදගුරු සමුළු සම්මේලනයේ ආරම්භය හා විකාශය පිළිබඳ විස්තරයක් කරන්න.***

ආසියානු රදගුරු සමුළු සම්මේලනයේ ආරම්භය ඇති වුනේ ආසියානු රදගුරුවරු සමූහයක් 1970 නොවැම්බර් මාසයේ දී පිලිපීනයේ 06 වන පාවුළු ශුද්ධෝත්තම පියතුමන් හමු වීමත් සමගමය. එය මුලදී ආසියානු රදගුරු ව්‍යාපාරය නමින් ආරම්භ විය. මෙම ව්‍යාපාරය මගින් ආසියානු රදගුරු සමුළු සම්මේලනය ආරම්භ කිරීමේ නීතිරීති සාකාච්ඡා කොට කෙටුම්පත් කරන ලදී. මෙලෙස 1971 මාර්තු මාසයේ හොංකොන් නුවරදී රැස් වූ ආසියාවේ රදගුරුවරු ආසියානු රදගුරු ව්‍යාපාරය ආසියානු රදගුරු සමුළු සම්මේලනය යන නමින් සම්මත කර ගන්නා ලදී. මෙය 1972 නොවැම්බර් මාසයේ දී වතිකානය මගින් නිල වශයෙන් පිළිගෙන අනුමත කරනු ලැබීය. ආරම්භයේ දී මෙම සමුළුවේ සාමාජිකත්වය රටවල් 15 ක් විසින් ලබා ගත් අතර ක්‍රමයෙන් තවත් රටවල් 10 ක් පමණ අනුබද්ධිත සාමාජිකත්වය ලබා ගත්හ. ආසියානු රදගුරු සමුළු සම්මේලනය සාමාජිකයන් විසින් තෝරාගත් විධායක මහා ලේකම්වරයකු විසින් පාලන කරනු ලබන අතර සමුළුවට විවිධ සේවාවන් සඳහා කාර්යාංශ 09 ක් ඇතුළත් වේ.

***ii. ආසියානු රදගුරු සමුළු සම්මේලනය මගින් (FABC) සාමය සහ සංස්කෘතිය සම්බන්ධයෙන් සිදු කර ඇති ඉගැන්වීම් මොනවාදැයි පැහැදිලි කරන්න.***

සාමය දෙවියන් වහන්සේගෙන්ම නික්මෙන්නකි. ක්‍රිස්තුත් වහන්සේ උපන් අවස්ථාවේ දී දේව දූතයක් සාමය පතන අතර උන්වහන්සේ උත්ථානයෙන් පසු තම ශ්‍රාවකයන්ට පතන්නේද සාමයයි. ආසියානු රදගුරු සමුළු සම්මේලනය (FABC) තම කලාපය තුළ සාමය ගෙන ඒමේ අවශ්‍යතාවය වටහා ගෙන සිටී. සාමය ඇති වීමට නම් සාධාරණත්වය යුක්තිය ඉටු වීම අවශ්‍ය බව (FABC) අවධාරණය කරයි. මේ සම්බන්ධයෙන් සියළු පැවිදිවරුන් ද ගිහි ජනතාව ද ක්‍රියාකළ යුතු බව පවසයි. විවිධ සංවර්ධන ක්‍රම මගින් අධ්‍යාපනය ලබා දීම තුළින් ජනතාවගේ ජීවිත තත්වයන් උසස් බවට නංවාලීම සාමය ඇති කිරීමට අත්‍යවශ්‍ය බව අරසසය පිළිගනී. ඒ සමගම රජයේ මේ සඳහා වූ වගකීම ද අවධාරණය කරයි. විවිධ ජාතීන් පිළිගැනීම ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දීම හා රැකදීම ගැන අරසසය තම අදහස් දක්වයි. සංස්කෘතිය මිනිස් ජීවිතය හා මුළුමණින්ම බැඳී පවතින්නකි. තමන්ගේ අනන්‍යතාවය රැඳී ඇත්තේ තමන්ගේ සංස්කෘතිය තුළයි. යම් ජාතියක සංස්කෘතිය ගරු කිරීම හා රැකදීමෙන් තොරව කිසිවිටකත් එම ජාතිය තුළ සාමය ඇති කළ නොහැකිය. ඕනෑම සමාජයක ඇති වටිනාකම් රැකදීම ගරු කිරීමේ ඇති අවශ්‍යතාවය අරසසය අවධාරණය කරයි. ඕනෑම සමාජයක භෞතික, ආගමික, සමාජ ආදී වටිනාකම් ගැබ්ව ඇත. ඒවා ඒ සමාජයේ අනන්‍යතාවය සුරකින සම්පතයි. සංස්කෘතිය යනුවෙන් හඳුන්වන්නේ ජාතිය සතු එම සම්පත්වල එකතුවයි. සභාව සෑම සංස්කෘතියක්ම එකසේ ගරු කරයි. විශේෂයෙන් ආසියානු සාමාජය ස්වභාව ධර්මයත් සමග බැඳී පවතින්නකි. ආසියානු සමාජයේ ඇති මෙම ස්වභාවය සහ විවිධත්වය අරසසය පිළිගනී. ඒවා තුළින් දෙවියන් සොයා යාමට ඉඩකඩ සලසා දෙයි. සැබෑ ලෙසම කිතු දහම ආසියාව තුළ මාංශගත කළ හැක්කේ මෙම ආසියානු මිනිස් වටිනාකම් පිළිගෙන ඒවා සුභාරංචිය පැතිරවීමට උපයෝගී කර ගැනීමෙනි.

***iii. ලෝක කිතුනු සභා සම්මේලනය (WCC) මගින් සාමය හා කිතුනු එකමුතුව සම්බන්ධයෙන් කර ඇති ඉගැන්වීම් මොනවාදැයි දක්වන්න.***

සාමය ප්‍රචණ්ඩත්වය ඉදිරියේ නිහඬව සිටීම හා ඒ වෙනුවෙන් කඳුළු වැගිරවීම හෝ තත්වය ඇති සැටි පිළිගැනීම සාමය නොවේ. සාමය ක්‍රියාකාරි එකකි. සාමය ඇති කිරීමට නම් ප්‍රචණ්ඩත්තවය යුද්ධය නැති කිරීමට අප ක්‍රියාකාරි විය යුතු යි. කළ හැකි දේ කළ යුතුයි. අද සමාජය තුළ දක්නය ලැබෙන විවිධ අපචාර දූෂණ හමුවේ සභාවක් ලෙස අප හඩනැගීම අවශ්‍ය වේ. මේ සඳහා කිතුනු සමගිය ද ඉතාමත් අවශ්‍යය. සියල්ලන් ක්‍රිස්තුත් වහන්සේ තුළ ඒකරාශී වීම පමණක් මෙම සාමය ගෙන ඒමට හැකි වේ. ලෝකය තුළත් අප අවටත් සාමය ගෙන ඒම සඳහා අපි ශුභාරංචියේ බලය සහ ආලෝකය ලබා ගත යුතුය. ප්‍රචණ්ඩත්වය නැති කිරීමට මිත්‍රත්වයද අවශ්‍ය වේ. එය අවශ්‍යතාවයක් පමණක් නොව දේව ධාර්මික සංකල්පයකි. ක්‍රිස්තුත් වහන්සේ පැමිණියේ අප එක්සත් කිරීමටය. උන්වහන්සේ අප මිතුරන් ලෙස බාර ගෙන ඇත. සුභාරංචිය දේශනා කිරීම පිණිස තම ශ්‍රාවකයන් යවමින් ක්‍රිස්තුත් වහන්සේ පැවසුවේ ද යම් තැනකට ගිය කළ එහි වැසියන්ට සාමය පතන්න කියාය.

<u>එකමුතුකම</u>

එකමුතුකම ඇති වන්නේ සාමය ඇති තැනය. සාමය ඇති වීමට එකමුතකම අවශ්‍යය. ලෝක කිතුනු සභා සම්මේලනය ලොව පුරා තිබෙන ලෝක කිතුන සභා සම්මේලනවල එකතුවකි. ඒවා එකින් එක වෙනස්ය. WCC මෙම විවිධත්වය පිළිගනී. එකමුතුව සඳහා විවිධත්වය පිළිගැනීම අවශ්‍ය වෙයි. අනෙක් අතට මෙම සියළු සභා එකට බැඳ තබන බැම්මක් ඇත. ඒ ක්‍රිස්තුන් වහන්සේයි. සියල්ලන් එක්ව සිටින්නේ උන්වහන්සේව පිළිගැනීම මතය. WCC එක එක සභාවේ විවිධත්වය මෙන්ම විවිධ හැකියාවන් ද පිළිගනී. එම හැකියාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාර කිරීමේ අවශ්‍යතාව පිළිගනී. සියලු දෙනා දේව සමාන කමට හා දේව ස්වරූපයට මැවූවන් බව පිලිගැනේ. සියළු සභාවේ අවශ්‍යතාවයන් මත සියළු සභාවන් එක්සත් කර ක්‍රිස්තුන් වහන්සේව ලොකයට ප්‍රදානය කිරීමට WCC උත්සාහා දරයි.

***iv. ශ්‍රී ලංකා සමාජයේ ඇති විවිධ ගැටුම් හමුවේ සාමය හා සංසිදියාව ඇති කිරීමට සිදු කළ යුතු දේ සම්බන්ධව ඔබේ අදහස් පැහැදිලි කරන්න.***

ශ්‍රී ලංකා ජන සමාජය ප්‍රධාන ජාතීන් 03 කින් හා ප්‍රධාන ආගම් 04 කින් සැදුම් ලත් එකකි. සැබැවින්ම මෙම විවිධත්වය සමාජය වඩාත් ඔපවත් කිරීමට හේතුවක් වියයුතුය. එක් එක් ආගමික වටිනාකම් ගරු කිරීම මගින් සමාජය වඩාත් ගුණ ගරුක වීමට හේතුවක් විය යුතුය. එහෙත් අවසානාවකට මෙන් මෙම විවිධත්වය සමාජය ඔපවත් කිරීම වෙනුවට සමාජය කඩා වැට්ටවීමට හේතුවක් කරගෙන ඇති බව පෙනේ. විටෙක අසන්නට ලැබෙන්නේ එක් ආගමකට අයත් පිරිසක් විසින් තවත් ආගමකට අයත් පිරිසකගේ ආගමික ස්ථාන විනාශ කිරීමකි. නැතිනම් වෙනත් පිරිසකට ආගමික ස්ථානයක් සාදා ගැනීමට බාධා කිරීමකි. එලෙසම විවිධ ජාතීන් එකට විසූවත් සාධනීය හෝ ක්‍රියාකාරි සම්බන්ධයක් නැත. ඒ වෙනුවට තම ජාතිය අයිතිවාසිකම් දිනාගැනීමට සටන් වදින බව පෙනේ. මේ හැරෙන්නට රට සංවර්ධනයට තම ශ්‍රමය හා බලය යොදවනු වෙනුවට එක් එක් දේශපාලන පක්ෂ තම වගකීම අමතක කර බලය තහවුරු කර ගැනීමේ සටනක යෙදී සිටී. මෙවන් පසුබිමක් හමුවේ කිතුනු අපට විශාල වගකීමක් ඇත. මන්ද යත් කිතුනු ජනතාව ජාතීන් වශයෙන් බැලුව හොත් ප්‍රධාන ජාතීන් 02 ක වන සිංහල හා දෙමළ ජාතීනට අයත්වන අතර ඒ අයගේ භාෂාව කතා කරති. අනෙක් අතට කිතු දහම අදහන්නෝ දෙමළ සිංහල යන ජාතීන් 02 ටම අයත් වෙති. මේ නිසා එකමුතුකම හා සාමය පෙන්වීමට කිතුනු අපට ඉතා හොඳ පසුබිමක් ඇත. මෙය ඉටු කිරීම කිතුනු අපේ වගකීමයි. ක්‍රිස්තුන් වහන්සේ පැමිණියේ ද සියල්ල එක්සේසත් කිරීමටයි. එකම ජනතාවක් තුළ එකමුතු කිරීමටයි. උන්වහන්සේ බලාපොරොත්තු වූ එම කාර්ය සිදු කළ හැක්කේ කිතුනුවන් වශයෙන් අප සියල්ලන් සමග එකමුතු කමෙන් හා සාමයෙන් විසීමේ ආදර්ශය දීමෙන් පමණි.